භගවත් පුරාණයෙහි දෙළොස්වන සඤ්ඣයෙහි දෙවන අධ්‍යායෙහි පරීක්ෂිත් නම් රජහු කෙරෙහි ශුක නම් ඍෂීන් විසින් කියනලද හෙයින් පරීක්ෂිත්හුගේ උත්පත්තියට අනතුරුව (1510) එක්දහස් පන්සිය දසවෂියක් පමණ මිතවෂිය ඉකුත්ව ශියනඳ්හි නන්‍ද රජහුගේ රාජ්‍යකාලය වීයයි නිශ්චය කරනු ලැබේ. මේ ශ්ලෝකයෙහි "පඤ්ච" යන පදය සාමාන්‍යාධිකරණ බවට අනුරොධ වශයෙන් "ශතම්" යන මීට "ශතානි" කියා හෙවත් සිය වල් කියා අර්ථ්‍ය යුතුවෙයි. මෙහි එකත්වය වෙදසම්බන්ධවූ සඤ්ඤෛක වාක්‍යත්වයෙන් ලද්දකි. එහෙයින්ම "ඍෂයෝ මූඝනා සතිෂඨන්නාඃබදශතං නෘණාම්"යි සප්තර්ෂීන්ගේ නක්ෂත්‍ර යන්හිලා ශතවර්ෂාතමක හොගකාලයක් කියා "තෙ තදීයෙ වීජාඃ කාලෙ අධුනාවාශ්‍රිතාඃමයා" යිද "තදුදෙවර්ෂියඃ සප්ත මඝාසු විව රනනිහි තදු ප්‍රවෘත්තාසත්‍රු කලිඃ"යිද භගවත් පුරාණයෙහි දෙළොස් වන සඤ්ඣයෙහි දෙවන අධ්‍යායෙහි සප්තර්ෂීන් මා නැකතෙහි සිටිකාල්හි කලියුගය පැවති හෙයිනුදු කලියුගය සම්බන්ධ ශතවර්ෂ කාලය අතර පරීක්ෂිත්හුගේ උත්පත්තිකාලය වීයයි නිශ්චය කරනු ලැබේ. එසිනුදු බෙහෙවින් කලියුග වර්ෂයෙන් අසූ හවිරුද්දක් ඉක්මගිය කල්හි පරීක්ෂිත්හුගේ උත්පත්තිකාලය වීය. එසින් (1510) එක්දහස් පන්සිය දසහවිරුදු කාලයක් මිතවෂි ඉක්මගිය කල්හි නන්‍ද රජහුගේ රාජ්‍යාභිෂේකය වූයේය. පුත්‍රයන් සහිත නන්‍ද රජුන් නවදෙනකුන්ගේ රාජ්‍යකාලය හවිරුදු සියයක් තුළමවිය. මෙසේ කලියුගය සම්බන්ධ (1690) එක්දහස් සසිය අනූ හවිරුද්දක් මිතවෂියාගේ සොළුවර පමණ නන්‍ද රජුන්ගේ රාජ්‍යකාලය සම්බන්ධවූ පශ්චිමකාලය වීයයි අනුමාන කරනු ලැබේ. එම කාලය සකන්‍ද පුරාණයෙහි පෑහැදිලි කොට කියන ලදි.

"තතොපි විසහස්‍රෙ දෘඩික ශතත්‍රයෙ
භවිෂ්‍යං නන්ද රාජ්‍යඤ්ච වාණක්‍යො යාන් හනිෂ්‍යති"සී

මෙහි භාවය "විසහස්‍රෙ" යනු නිර්ධාරණයෙහි සප්තමියි. දෙදහසක් හවිරුදු අතුරෙහි කියා අර්ථ බිණිය යුතු. එසේ ගත් කල්හි දසයක් අධික නොට තුන්සියයක් හවිරුදු පවත්නාකල්හි යයි හැඟෙයි. එසේද කලියුගය සම්බන්ධ අනුවක් අධික නොට ඇති සොළොස් සියයක් හවිරුදු හෙවත් එක්සිය සසිය අනුවක් හවිරුදු ඉක්මගිය කල්හියයි අර්ථ ලැබේ. "නන්දරාජ්‍යම්" යනු නන්දරජුන්ගේ රාජ්‍යකාලය යන අර්ථයි. උත්තරවාක්‍යයෙහි "යාන්" යන බහු වචන නිර්දෙශය හෙයින්. මේද පළමු කියනු ලබන භගවත් පුරාණයෙහි කීමට සමාන කීමක් වශයෙන් ලැබේ.

"ෂාඃකෙෂු නව ශෛලෙඤ්ජුරාම (3179)යොගෙ කලෙගීතාඃ"සි කියන ලද මාත්‍රයෙන් දැන් ඉක්මගියාවූ ශකවර්ෂ එක්දහස් හත්සිය අසූපහ තුන්දහස් එකසිය හැත්තෑ නවයවූ මිතවර්ෂයෙහි සෙදූකල්හි කලියුගවර්ෂයෙන් හවිරුදු හාරදහස් නවසිය හැටහතරක් මිතවර්ෂ ඉක්ම ගියාහයි අනුමාන කරනු ලැබේ. ඔවුන් අතුරෙහි පළමු කියනලද එක්දහස් සසිය අනුවක් මිතවර්ෂ වියොග කළ කල්හි දැන්නන්ද රජහුගේ රාජ්‍යකාලය සම්බන්ධ පරමාවධි කාලය තුන්දහස් දෙසිය හැත්තැහතරක් මිනවර්ෂ ඉක්ම ගියාහයි අනුමාන කරනු ලැබේ. නන්ද රජුන්ගේ රාජ්‍යකාලය භගවත් පුරාණයෙහි ශතවර්ෂයක්යයි කියනලදී. එහෙයින් මින් පළමු කියනලද හවිරුදු තුන්දහස් දෙසිය හැත්තැහතරේ පටන් හවිරුදු තුන්දහස් තුන්සිය හැත්තැහතර සෙළවරකොට නන්ද රජුන්ගේ රාජ්‍යකාලය ඒය. එතැන් පටන් චන්‍රගුප්ත රජහුගේ රාජ්‍යකාලයයි.

සම්හර කෙනෙක් වනාහි "තතොපි ත්‍රිසහස්‍රෙ දශාධික ශතත්‍රයෙ" යන සකර්ම පුරාණ පාඨය කල්පනාකොට හවිරුදු තුන්දහසක් අතුරෙහි දසයක් අධිකකොට ඇති තුන්සියයක් හවිරුදු පවත්නා කල්හි යයි ව්‍යාඛ්‍යානකොට කලියුග වර්ෂයෙන් (2690) දෙදහස් හයසිය අනුවක් මිතවර්ෂ ඉක්මගිය කල්හි නන්ද රජුන්ගේ රාජ්‍යකාලය ඒය. ඉන්පසු ශතවර්ෂාවසානයෙහි චන්‍රගුප්ත රජහුගේ රාජ්‍යකාලයයි කියති. එපරිද්දෙන් පළමු කියන ලද රාජ්‍යකාලයෙන් හවිරුදු දහසක්හුගේ සෙළවර නන්ද රජ චන්‍රගුප්ත රජ යන දෙදෙනාගේද රාජ්‍යකාලයෝ යයි කියනු ලැබෙන්. මේකීවදඉංග්‍රිසිභාෂාවෙන්ලියනලද මේ රජුන්ගේරාජ්‍ය

කාල සම්බන්ධ ඉතිහාස ග්‍රන්ථයන්ට අනුව යෙයි. එසේ වුවත් භගවත් පුරාණයෙහි කීමට විරුද්ධවිය හැකියයි අනික් ප්‍රමාණයකින් ආදර නොකරණ ලද්දේයයි සිතිය යුතුයි.

ඒ කාලයෙහි පාණිනී, වරරුචි, ව්‍යාඩි, යන මේ පණ්ඩිත ප්‍රවරයන් තුන්දෙනා විසින් පළමු කියනලද සූත්‍ර, වාර්තික, සඞ්ග්‍රහ යන ග්‍රන්ථත්‍රය නිපදවන ලද්දේය. බොහෝ සෙයින් මේ ග්‍රන්ථත්‍රය මේ කාලයෙහිම නිපදවනලද බව අන්‍ය ප්‍රකාරයකින්ද හැඟේ. විඳුනෙශ්වර යොගීහු විසින් කරණලද මිතාක්ෂරාශෙෂ යෙහි "පායාදුවඤ්ඤාරං ජගදිදමඛිලං වික්‍රමාදිත්‍ය දෙවඃ"යි දක්වා මිතාක්ෂරාඛ්‍ය ග්‍රන්ථය සංවත් නම් ශකවර්ෂය පැවැත්වූ වික්‍රමාදිත්‍ය රජහුගේ (1921) එකදහස් නවසිය විසිඑක්වෙනි වර්ෂයෙහි කරණ ලද්දේයයි නිශ්චය කරයි. ඒ සම්බන්ධව "යාඥවල්ක්‍ය" නම්වි වෘත්තියෙහි ව්‍යවහාරාධ්‍යායෙහි "ව්‍යවහාරාන්නෘපඃ පශ්‍යෙදඞ්ගි ද්විර්බ්‍රාහ්මණෛඃ සහ" යන වචනයන්ට කළ ව්‍යාඛ්‍යාවෙහි සහ යයි තෘතීයා නිර්දෙශයෙන් විඥද්බ්‍රාහ්මණයන්ගේ අප්‍රාධාන්‍යය 'සහයුක්තෙතප්‍රධානෙ" යන පාණිනීය සූත්‍රය සමරණය කිරීමෙන් 2319 වර්ෂ ප්‍රමාණ කිරීම්වශයෙන් ලියනලද හෙයින් මේ පාණිනි ව්‍යාකරණය යාඥවල්ක්‍යයට පුරාතන බවද, ඊටත් වඩා පූරාතනවූ මෙධාතිථි නම් පණ්ඩිතයකු විසින් කරණ ලද "මනුභාෂ්‍ය යෙහි" "යථාවත්" යන පදව්‍යාඛ්‍යානයෙහි පාණිනියෙහි 'තදර්හම්, යන 5. 1. 117. සූත්‍රයෙන් කළ වතිප්‍රත්‍යයයි ලියනලද හෙයින්ද පාණිනී ව්‍යාකරණය මනුභාෂ්‍යයටත් පුරාතන බවද, මිතාක්ෂර යෙහි අසහාය පණ්ඩිතයෙක්වූ මෙධාතිථි ඊටත් කොට ඇත්තන්ගේ ව්‍යාඛ්‍යානයම චතුරස්‍ර (සතරැස්) යයි කියා මිතාක්ෂරයටත් වඩා මෙධාතිථි පුරාතන බව අවබොධකිරීමෙන් පාණිනි ව්‍යාකරණය ඊටත් වඩා පුරතන බව යහපත්සේ නිශ්චය කොට තිබේ.

එසේම භර්තෘහරි විසින් කරණ ලද "වාක්‍යපදීය" ග්‍රන්ථයෙන් උපුටාගන්නාලද ශ්ලොක වලින්ද මහාභාෂ්‍ය "වාක්‍යපදීය"ටත් වඩා පුරාතන බව නිශ්චයවන හෙයින්ද මහාභාෂ්‍යයට වඩා "පාණිනීව්‍යාකරණය" පුරාතන බව නිශ්චය වෙයි. භාෂ්‍ය කාරයා විරතෙම චන්ද්‍රගුප්ත රජහුගේ රජ්‍යකාලයට පසුකාලයකවූ බව පළමුත් දක්වනලද හෙයින් තද්ව්‍යාඛ්‍යාන සූත්‍ර වාර්තික කාරයන්ගේ කාලය ඊටත් වඩා පුරාතන බව මෙයින් ඵලිතවිය. නන්ද රජුන්ගේ රාජ්‍යකාලය ශතාත්මක කාලය මැයි. භගවත් පුරාණයෙහි දෙළොස්වන සකඞ්කයෙහි එක්වන අධ්‍යායෙහි දක්වනලදී.

"මහානන්දිසුතෝ රාජන්! ශූද්‍රාගර්භී සමුද්භවඃ,
මහා පද්මපතිඃ කශ්චිත්තානන්දඃ ක්ෂත්‍ර විනාශකෘත්.
තස්‍ය චාෂ්ටෝ භවිෂ්‍යන්ති සුමාල්‍ය ප්‍රමුඛාඃ සුතාඃ,
යෙ ඉමාං භොක්ෂ්‍යන්ති මහීං රාජානශ්ච ශතංසමාඃ" යිද

නැවතද:-

"නවනන්දාන් විජඃ කශ්චිත් ප්‍රපන්නා හුඩරිෂ්‍යති,
තෙෂා මභාවෙ ජගතීං මෞර්‍යා භොක්ෂ්‍යන්ති වෙ කලෞ
ස එව චන්ද්‍රගුප්තං වෙ විප්‍රෝ රාජ්‍යෙභි ෂෙක්ෂ්‍යති"යිද

මෙහි නව නන්ද රජුන්ගේ රාජ්‍යකාලය ශතවර්ෂයක්යයි කියා "චාණක්‍ය" නම් බ්‍රාහ්මණතෙම නන්ද රජුන්මරා මෞර්‍යවංශයන්ගේ ආදි රජවූ චන්ද්‍රගුප්ත කුමාරයා රාජ්‍යයෙහි අභිෂෙක කරන්නේ යයි කියනලදි. ඒ නන්ද රජුන්ගේ රාජ්‍යකාලය චන්ද්‍රගුප්ත රජහුගේ දරුමුනුබුරු පරම්පරා දසයක් දක්වා විසිනරසකට කියා නැවත "මෞර්‍යාස්තෙතෙ දශනෘපාඃ සප්තත්‍රිංශවර්ෂතං සමාඃ"යි එහිම කියන ලදි. මෙසේද නන්ද රජුන්ගේ කාලයෙහි පටන් සත්තිසක් අධිකවූ සියක් ඉව්රුද්දක් චන්ද්‍රගුප්තාදි මෞර්‍යවංශිය රජුන්ගේ රජ්‍යකාලයයි. මෙපරිද්දෙන්ද පාණිනී ඍෂිවරයන් පටන් සොට ඇත්තවුන්ගේ උත්පත්ති කාලයට අනතුරුව ශත වර්ෂයෙක්හි අව්වර්ෂයෙන් මින්පෙර 2175 හව්රුදු කාලයෙහි හෝ අනවමතයෙක්හි 3175 හව්රුදු කාලයෙහි හෝ චන්ද්‍රගුප්ත රජහුගේ රජ්‍යකාලය වීය. මේ රාජ්‍යකාලය මෙසේ ඇතිකල්හි මීට කොතෙක් කලකට පසුව පතඤ්ජලි විසින් කරණලද 'මහාභාෂ්‍ය' නම් ග්‍රන්ථයාගේ පහළවීම විදුසි මහා භාෂ්‍යයෙහිම පළමු කියන ලද ප්‍රත්‍යවධාරණයෙන්ම යට කියන ලද පරිද්දෙන් යහපත්ව නිශ්චය වන්නු ලැබිය.

මෙසේ සූත්‍ර, වාර්තික, භාෂ්‍යයන් සම්බන්ධ උත්පත්තිකාලය පැහැදිලිවූ කල්හි ඒ සම්බන්ධව කරණලද සෙසු ව්‍යාඛ්‍යාන ප්‍රකරණයන්ගේද උත්පත්තිකාලයත් මෙහිදී පැහැදිලි කිරීම යුතු යයි හැනෙයි. නුමුත් ඒ සම්බන්ධ මෙහිදී වැඩියක් කාලානික්‍රමණය නොකොට ඒ සම්බන්ධවූ ග්‍රන්ථ හා ග්‍රන්ථ කර්තෘ නාම විෂයාදිය පමණක් දැන් දක්වන්නු ලැබේ.

ග්‍රන්ථකර්තෘ ග්‍රන්ථනාම විෂයාදිය.

කර්තෘනාම.	ග්‍රන්ථනාම.	විෂයාදිය.
1 හර්‍යාහරි විසින් කරණලද	මහාභාෂ්‍යවාක්‍යාවද	(මේ මහාභාෂ්‍යයට කළ වාක්‍යාර්ථයෙකි)
2 හර්‍යාහරි විසින් කරණලද	වාක්‍යපදීයද	(මේ මහාභාෂ්‍යයෙහි න්‍යායදර්ශන පූර්වකව ණීතවෙකි.)
3 පුණ්‍යරාජයන් හා හෙලාරාජයන් විසින් කරණලද	වාක්‍යපදීය වාක්‍යාවද	(මේ වාක්‍යපදීයෙහි විස්තරවණීතාවෙකි.)
4 වාමන යන අපර නාමයක් ඇති ජයාදිත්‍යයන් විසින් කරණලද	කාශිකාවෘත්තියද	(මේ පාණීනීය සූත්‍රක්‍රමානුසාරීව කළ සොදුහරණ වාක්‍යාර්ථවෙකි.)
5 ලක්දිව සිසු ධර්මකීර්තිපාදයන් විසින් කරණලද	රූපාවතාරයද	(මේ පාණීනීසූත්‍රානුසාරී සොදුහරණ වෘත්තියෙකි.)
6 හරදත්තාමිත්‍ර විසින් කරණලද	න්‍යාස යන අපරනාමයක් ඇති පදමඤ්ජරීයද	(මේ ඉෂ්ටප්‍රසිද්ධ්‍යානවාප්තිරේකයෙන් සූත්‍රාක්ෂරවලින්ම සියලු පද සාධන ක්‍රමය දක්වන ග්‍රන්ථයෙකි.)
7 ජිනෙන්ද්‍ර විසින් කරණලද	පඤ්ජිකාවද (පඤ්ඣිකාවද)	(මේ කාශිකාවෘත්ති ව්‍යාඛ්‍යාවෙකි.)
8 සොයට විසින් කරණලද	භාෂ්‍යප්‍රදීපයද	(මේද මහාභාෂ්‍යයෙහි ව්‍යාඛ්‍යානයෙකි)
9 නාගෙශභට්ට විසින් කරණලද	භාෂ්‍යප්‍රදීපයද	(මේද මහාභාෂ්‍ය ව්‍යාඛ්‍යානයෙකි.)
10 ඊශ්වරවාසු විසින් කරණලද	භාෂ්‍යප්‍රදීප විවරණයද	(මේ භාෂ්‍යප්‍රදීප ව්‍යාඛ්‍යානයෙකි.)
11 රාමචන්ද්‍රාචාර්‍යයන් විසින් කරණලද	ප්‍රක්‍රියාකෞමුදියද	(මේ ප්‍රක්‍රියානුසාරයෙන් පාණීනීය සූත්‍රයන් සුදුසු තැන යොදා කරණලද සොදුහරණ ව්‍යාඛ්‍යානයෙකි.)
12 ශ්‍රී කෘෂ්ණ විසින් කරණලද	ප්‍රක්‍රියාකෞමුදී ව්‍යාඛ්‍යාවද	(මේ පාණීනීය සම්බන්ධ විස්තර ව්‍යාඛ්‍යානයෙකි.)
13 විට්ඨල විසින් කරණලද	ප්‍රසාදයද	(මේ සූත්‍ර ව්‍යාඛ්‍යානයෙකි.)
14 ජයන්ත විසින් කරණලද	තන්ත්‍රවාක්‍යයද	(මේ සොදුහරණප්‍රසාදව්‍යාඛ්‍යානයෙකි)

15 මාධවාචාර්යයන් විසින් කරණලද	මාධවීය වෘත්තියද	(මේ අෂ්ටාධ්‍යායීසූත්‍රව්‍යාඛ්‍යානයෙකි.)
16 භට්ටොජිදීක්ෂිත විසින් කරණලද	සිද්ධාන්තකෞමුදියද	(මේ ප්‍රක්‍රියානුසාරීව සූත්‍රොද්ධරණය පූර්ණකොටඇති සොදුහරණ සූත්‍ර විවෘතියෙකි.)
17 භට්ටොජිදීක්ෂිතවිසින් කරණලද	ප්‍රෞඪමනොරමාවද	(මේ සිද්ධාන්ත කෞමුදී ව්‍යාඛ්‍යානයෙකි)
18 හරිදීක්ෂිත විසින් කරණලද	ශබ්ද රත්නයද	(මේ පෞඪමනොරමා ව්‍යාඛ්‍යානයෙකි.)
19 වෛද්‍යනාථ විසින් කරණලද	භාවප්‍රකාශයද	(මේද පෞඪමනොරමාව්‍යාඛ්‍යානයෙකි)
20 නාගෙශභට්ටයන් විසින් කරණලද	ශබ්දෙන්දුශෙඛරයද	(මේ සිද්ධාන්ත කෞමුදී ව්‍යාඛ්‍යානයෙකි.)
21 වෛද්‍යනාථයන් විසින් කරණලද	විද්‍යාසිද්ධාන්තමාලාවද	(මේ ශබ්දෙන්දුශෙඛර ව්‍යාඛ්‍යානයෙකි.)
22 ඥානෙන්ද්‍ර සරස්වතී විසින් කරණලද	තත්ත්වබොධිනීයද	(මේද සිද්ධාන්තකෞමුදී ව්‍යාඛ්‍යානයෙකි)
23 භට්ටොජිදීක්ෂිත විසින් කරණලද	ශබ්දකෞස්තුභයද	(මේද සූත්‍රානුසාරයෙන් භාෂාදියෙහි කියනලද අර්ථයන්හි යුක්තිදක්වීම පුළුල් කොට කරණලද ව්‍යාඛ්‍යානයෙකි.)
24 වෛද්‍යනාථයන්විසින් කරණලද	ප්‍රභාවද	(මේද ශබ්දකෞස්තුභව්‍යාඛ්‍යානයෙකි)
25 සදාශිවපණ්ඩිතයා විසින් කරණලද	ගූඪාර්ථදීපනියද	(මේද සූත්‍රක්‍රමානුසාරීවූ සූත්‍ර ව්‍යාඛ්‍යානයෙකි.)
26 වරදරාජයන්විසින් කරණලද	මධ්‍යකෞමුදියද	(මේ සිද්ධාන්ත කෞමුදියෙහි සාරාංශයෙකි.)
27 වරදරාජයන්විසින් කරණලද	ලඝුකෞමුදියද	(මේද සිද්ධාන්ත කෞමුදියෙහිම සාරාංශයෙකි.)

28	ධරණීධරයන්විසින් කරණලද	වෛයාකරණ සම්මතයද	(මේද සොදාහරණ සූත්‍රානුසාරී ව්‍යාඛ්‍යා කාරිකාදිය සහිත භාෂාවාර්තිකාපෙ සම්තාංශ සහිත ග්‍රන්ථයෙකි.)
29	ශ්‍රී නාරාතාථතකීවාවස්පතීන් විසින් කරණලද	සරලාවද	(මේදසිඛානත කෞමුදී ව්‍යාඛ්‍යානයෙකි

ප්‍රකරණ ග්‍රන්ථ නාමාදිය.

30	කොණ්ඩභට්ටයන් විසින් කරණලද	වෛයාකරණ භූෂණයද	(මේ ශබ්දශක්ති නිරූපණයෙකි)
31	හරිවල්ලභයන් විසින් කරණලද	වෛයාකරණභූෂණ ඤ්ඡිණයද	(මේද වෛයාකරණ භූෂණ ව්‍යා ඛ්‍යානයෙකි.)
32	නාගෙශභට්ටයන් විසින් කරණලද	මඤ්ජූෂාවද	(මේද ශබ්දශක්ති නිරූපණයෙකි.)
33	වෛද්‍යනාථයන් විසින් කරණලද	කලාවද	(මේද මඤ්ජූෂා ව්‍යාඛ්‍යානයෙකි.)
34	ක්ෂීරදේවයන්විසින් කරණලද	පරිභාෂාවෘත්තියද	(මේද පරිභාෂා ව්‍යාඛ්‍යානයෙකි.)
35	නාගෙශභට්ටයන් විසින් කරණලද	පරිභාෂෙන්දු ශෙඛරයද	(මේද පරිභාෂා ව්‍යාඛ්‍යානයෙකි.)
36	වෛද්‍යනාථයන් විසින් කරණලද	පරිභාෂාකාරිකාවද	(මේද පරිභාෂා ව්‍යාඛ්‍යානයෙකි.)
37	මෛත්‍රෙය රක්ෂිතයන් විසින් කරණලද	ධාතුපාඨප්‍රදීපයද	(මේද ධාතුපාඨ ව්‍යාඛ්‍යානයෙකි.)
38	ශ්‍රී නාරාතාථතකීවාවස්පතීන් සිවින් කරණලද	ශබ්දාර්ථතනයද	(මේද ව්‍යාකරණ සිඛානත දර්ශනයෙකි.)
39	ශ්‍රී නාරාතාථතකීවවාස්පතීන් විසින් කරණලද	ආශුබෝධයද	(මේද පාණිනී සාරාංශ සංකලනයෙකි.)
40	ශ්‍රී නාරාතාථ තකීවාවස්පතීන් විසින් කරණලද	ධාතුරූපාදර්ශයද	(මේද ක්‍රියාපද පරිදර්ශනයෙකි.)

වේ. සියලු ග්‍රන්ථයෝ පාණිනි ව්‍යාකරණය සම්බන්ධ පරිවාර ග්‍රන්ථයෝම වෙති. පාණිනි සූත්‍රපාඨයට අයත් සියලු සූත්‍රයන්ට "අෂ්ටාධ්‍යායී" යයි නමක්ද ප්‍රකාශ කළබව පළමුත් දැක්වීමු. මෙහිදු වෛදික ලෞකික සාධු ශබ්ද නිෂ්පත්තිය හා වෛදික ශබ්දයන්ගේ උදාත්ත, අනුදාත්ත, සවරිත යන ස්වර විධානයද දක්වයි. වැලිදු එකි එකි ප්‍රකරණයෙක්හි එකජාතීයවූ කාර්‍ය්‍ය යෝම දක්වන ලද්දාහ. ඒ කරණකොට ගෙන පඨන පාඨනාදියෙහිදී විශෘඛලත්වය ලබා ප්‍රක්‍රියානුසාරයෙන් අපෙක්ෂා කරණලද ඒ ඒ ස්ථානයන්හි වෙන් වෙන් වශයෙන් සූත්‍ර උපුටා ව්‍යාඛ්‍යාන කොටද ප්‍රක්‍රියාකෞමුදී සිද්ධාන්තකෞමුදී ආදි ග්‍රන්ථයෝ බෙහෙවින් සොදුහරණාදියෙන් විභාවිත කරණ ලද්දාහ.

සෘෂි පාණිනින් විසින්ම ධාතුපාඨ ග්‍රන්ථයෙහි භූ ආදිකොට ඇති දශ ගණයෙහි ධාතූහු අවී සහිතව දක්වන ලද්දාහ. ධාතු පාඨ යෙහිවූ ඒ සියලුම ධාතූහු අවී සහිතව සිද්ධාන්තකෞමුදී ග්‍රන්ථයෙහිදු සඞ්ග්‍රහ කරණ ලද්දාහ. අෂ්ටාධ්‍යායී සූත්‍රයන්හි දක්වන ලද ස්වරාදි ගණයන් ප්‍රකාශ කරනු පිණිස පාණිනි ඍෂීන් විසින්ම ගණපාඨ ග්‍රන්ථය රචනා කරණ ලද්දේය. ඒ ගණ පාඨයෙහි අෂ්ටාධ්‍යායී සූත්‍ර වලින් නිපදවනු නොහැකිවූ කාර්‍ය්‍ය විශෙෂයන්ගේ ප්‍රයොජනය පිණිස සමහර තැන සූත්‍රද දක්වන ලද්දාහ. ඒ සූත්‍රයන්ට ගණසූත්‍රයයි නමකුදු වෙයි. ශබ්දයන්ගේ පුංස්ත්‍රී ක්ලීව යන ලිඞ්ග හෙද අවබොධ කරවීම පිණිස "ලිඞ්ගානුශාසන" ග්‍රන්ථයද මහර්ෂි පාණිනි විසින්ම කරණ ලද්දේය. ඒ ලිඞ්ගානුශාසනයෙහිවූ සියලු සූත්‍රද ශ්‍රී නාරායණාර්ථ කර්ණාවස්පති භට්ටාචාර්‍ය්‍ය බ්‍රාහ්මණ පණ්ඩිතුමා විසින් සංශොධනය කරණලදුව සිද්ධාන්ත කෞමුදියෙහි ග්‍රන්ථාවසානයෙහි වෙනම ඡොදන ලද්දාහ. අක්ෂර ශික්ෂාව උගැන්වීම පිණිස මහර්ෂි පාණිනීන් විසින් කරණ ලද "ශික්ෂා" නාවැනි අතික් ග්‍රන්ථයකුදු ඇත්තේය. ශික්ෂානම් ග්‍රන්ථය ත්‍රිනයන නම් ආචාර්‍යයකු විසින් කරණ ලද්දේයයි අන්‍ය මතයක්ද නිබේ. වාර්තිකය ව්‍යාඛ්‍යාසී සූත්‍රයන්හි නොදක්වනලද උභයස්ථාන පිරසීම් වශයෙන් තත්තත්සූත්‍රයන්ගේ තාත්පර්‍යය ප්‍රකාශ කොට ව්‍යාඛ්‍යානය කිරීමයි. පාණිනී ව්‍යාකරණය සම්බන්ධව ශාකටායනාචාර්‍යයන් විසින්ම "උණාදිසූත්‍ර" නිපදවන ලද්දාහ. මේ උණාදිසූත්‍ර සම්බන්ධව උජ්ජලදත්ත නම් පණ්ඩිතයකු විසින් ප්‍රශස්ත වෘත්තියක්ද නිපදවන ලද්දේය. මේ උණාදි සූත්‍ර සම්බන්ධව ගොවර්ධන, ඍෂපණ්ණාදි පණ්ඩිතවරයන් විසින් කරණලද වෘත්තීහුද වෙති. උජ්ජලදත්තයන් විසින් කරණලද

වෘත්තියෙන්ම ඒ දත හැකියි. අපි මේ සම්බන්ධව මීට පළමුත් දැක් වීමු. මහාභාෂ්‍යය වෘත්ති සූත්‍ර වාර්ත්තික ව්‍යාඛ්‍යානයන් පෙරටු කොට ඇති ශබ්දශක්ති නිරූපණයෙන් යුක්ති දැක්වීමයි. මහා භාෂ්‍යයෙහි ප්‍රථමාධ්‍යායයෙහි ප්‍රථම පාදයෙහි නවාහ්නිකයන් හෙන් එම අධ්‍යායයෙහි ශබ්දානුශාසනයාගේ විෂය ප්‍රයෝජනාදිකු දක්වන ලද්දාහු වෙති. එම අධ්‍යායට "පස්පශාධ්‍යාය"යයි නමක් වෙයි.

සංක්ෂේපයෙන් මෙසේ දක්වන ලද්දේ පාණිනී ව්‍යාකරණය සම්බන්ධවූ පරිවාර ග්‍රන්ථයන්ගේ නම් හා තද්ග්‍රන්ථ නිර්මාණය කළාවූ පණ්ඩිතවරයන්ගේ නම් හා තත්තද්ග්‍රන්ථ විෂයකොට පැවති කරුණුද වෙති. මෙයින් පාණිනී ව්‍යාකරණයෙහි ඇත් තාවූ අතිසූක්ෂ්මවූ ගම්භීරාති ගම්භීරත්වය හා දුරවබෝධ දූෂිතබෝදි යද මනා පරීක්ෂාවෙන් යුක්තව බලන්නාවූ විචාරණබුද්ධිමත් තුව ණැති කාටවුවත් නිරායාසයෙන් ගහපත් සේ දැනගත හැකියි.

තවද (1) ශ්‍රී වොපදෙවාචාර්‍යවරයන් විසින් කරණ ලද "මුඤ්ධබොධ" ව්‍යාකරණයද, ශ්‍රී පද්මනාභදත්තාචාර්‍යවරයන් විසින් කරණලද"සුපද්ම" ව්‍යාකරණයද ශ්‍රී තාරානාථ තර්ක වාචස් පති භට්ටාචාර්‍යයන් විසින් කරණලද "ආශුබොධ"ව්‍යාකරණයද ශ්‍රී නීලමණි මුඛොපාධ්‍යාය නව්‍යාලඞ්කාර පඩිතුමා විසින් කරණ ලද "මණිමඤ්ජරී" වාකරණයද යන මේ ව්‍යාකරණ සතරක්ද, මෙකල පවතියි, මෙයින් පළමුකී 'මුග්ධබොධ" "සුපද්ම" යන ව්‍යාකරණ දෙක පුරාතනවූ ප්‍රශස්තතර ව්‍යාකරණ දෙකෙකි. "ආශුබොධ"ව්‍යාකරණයද පාණිනීය අළලා පාණිනීයටඅනුකූලව කරණලද හෙයින් ප්‍රශස්තතර මැයි. "මණිමඤ්ජරී" නම් ව්‍යාකර ණය සවලපවූ නූතන ව්‍යාකරණයෙකි. මේ ව්‍යාකරණ සතරම පාණිනී ව්‍යාකරණය ඇසුරු කොට ග්‍රන්ථකර්තෘවරයන්ගේ මතානු කූල පරිද්දෙන් අන් ප්‍රකාරයකින් නිපදවන ලද බව කිය හැකියි. එසේ වුවත් පාණිනී ව්‍යාකරණයෙහි පරිවාර ග්‍රන්ථයන්ගේ වශ යෙන්ම නොගිණිය හැකියි. "මුග්ධබොධය" හා "සුපද්ම" යන ව්‍යාකරණ දෙක කෂට දෙෂයන්ගෙන් සම්පගහවූවත් සංස්කෘත භාෂාව ඉගණීමට පිවිවහල් වන්නාවූ පැසසිය යුතුවූම ව්‍යාකර ණාඛ්‍යයන්ගෙන් අන්‍යතවූ ව්‍යාකරණ දෙකෙකි."ආශුබොධ"ව්‍යා

---

(1) භොජරාජතුමාද පණ්ඩිතප්‍රවරයෙකි. මේ රජතුමාවිසින්ම "භොජ ශබ්දානුශාසනය" නෙවත් ව්‍යාකරණයද සරස්වතී කණ්ඨා භරණාදී ප්‍රශස්තතර ග්‍රන්ථද කරණ ලද බව දක්වා තිබේ.

කරණය පාණිනීය මෙන් සමාවහා කටයුතු එකකි. "මණි මඤ්ජරී" නම් ව්‍යාකරණය එක් ප්‍රකාරයකින් මඳබුඩින්ට පහසු වෙන් සංස්කෘත භාෂාව ඉගණීමට උපකාරවන පිණිස පවත්නාවූ ව්‍යාකරණාඩ්ගයන්ගෙන් අසම්පූර්ණවූ කුඩා ව්‍යාකරණයකැයි කිය යුතුව තිබේ. අනුභූතිස්වරූපාචාර්‍යවරයන් විසින් සරස්වතීගේ වරප්‍රසාද ලැබීමෙන් කරණලද "සාරස්වත" ව්‍යාකරණය ව්‍යාකර ණාඩ්ග සම්පූර්ණවූ බාලයන්ට නිරායාසයෙන් ඉගණීම පිණිස උප කාරවූ පාණිනි ව්‍යාකරණයට අත්‍යන්තගීතත්‍රවූ පුරාතන පැසසිය යුතු ව්‍යාකරණයෙකි.

චඳ්‍ර ව්‍යාකරණය.

මීට අනතුරුව චඳ්‍රව්‍යාකරණය සම්බන්ධව කරුණු දක්වනුලැබේ.

"යඃ පතඤ්ජලි ශිෂ්‍යෙභ්‍යෝ භ්‍රෂ්ටෝ ව්‍යාකරණාගමඃ
කාලෙ ස දක්ෂිණාත්‍යෙෂු ග්‍රන්ථ මාත්‍රෙ ව්‍යවස්ථිතඃ
තදෙව මුත්පන්නාලපඃ සංජාතෝ ව්‍යාකරණාගමඃ"යි.

මේ යට දැක්වූ වාක්‍යපදීයාගත කාරිකාවෙකි. මෙසේ අන්‍යොන්‍යයන්ගේ වෛමාත්‍සර්‍යයෙන් හා ශාස්ත්‍රොපඥ පරිඥාන යෙන්ද සුදුසු පරිද්දෙන් පැවත ආවාවූ ව්‍යාකරණ ශාස්ත්‍රය පත ඤ්ජලි ශිෂ්‍යයන් කෙරෙන් කාලාතික්‍රමණයෙන් හීලිහි ගියේ දක්ෂිණ දිශාභාගයෙහි ග්‍රන්ථමාත්‍රයෙක්හි පාඨ මාත්‍රයක්ම ශෙෂවී පැවැත්තේය. ඉක්බිති කාලානන්තරයකින් චඳ්‍රාචාර්‍යාදීන් විසින් පුරාතන පාණිනි ව්‍යාකරණ ශාස්ත්‍රයද ලබාගෙන උපාඥවූ ඒ ව්‍යාකරණ ශාස්ත්‍රයෙන්ද මහාභාෂ්‍යයෙහි පැවැත්තාවූ සියලු නෘාය සාරයන්ද අනුව ගොස් නැවතත් ව්‍යාකරණ ශාස්ත්‍රය පැනිරීමට පමුණුවන ලද්දේය. යනු මෙහි භාවයි.

"පතිතා දෘගමං ලබ්ධ්වා භාෂ්‍යබීජානුසාරිභිඃ,
ස නිතෝ බහු ශාඛත්වං චඳ්‍රාචාර්‍යාදිභිඃ පුනඃ"යි

මේ කාරිකාවේ"පතිතාත්"යනු ත්‍රිකුට යයි ඊට කරණලද විෂා වේ පෙණේ. ත්‍රිකුට පර්‍වතයෙහි එක් පෙදෙසක හෙවත් එක්ගල් තලාවෙක්හි රාවණ නමැති පණ්ඩිතයකුවිසින් ලියනලද මුල් මහා භාෂ්‍යය තිබී පසුව බ්‍රාහ්මණ වේෂය ගත් රාක්ෂසයකු විසින් එතැ නින්ගෙනවුත්චඳ්‍රාචාර්‍ය්‍ය වසුරාතාචාර්‍යවරයන්පවත්කොටඇති එකල විසූ ආචාර්‍යවරයන්ට දෙනලද්දේය. යන මේ ප්‍රවෘත්තිය මීට පළමුත් දැක්විමු "චඳ්‍රාචාර්‍යාදිභිඃ" යන මෙහි ආදි ශබ්ද යෙන් වසුරාතාදී අනෘාචාර්‍යවරයන්ද ගැනෙයි. මේ ආචාර්‍ය්‍ය

වරයෝ වෘාගි පළමු වෘාකරණයාගේ තාතපය්‍ය එයින් ලබා ගෙන නිතර ශිෂ්‍ය ප්‍රශිෂ්‍යයන්ට හදුරවමින් බොහෝ විස්තාරයට පැහැණවූහයි ප්‍රකාශව තිබේ. මෙහි කථා ප්‍රවෘත්තිය අතිවිස්තරයි. පිණ්ඩාර්ථ මාත්‍රයක්ම මෙහි දැක්වීමු.

මේ කාරිකාවෙහි "වඤ්චාවාය්‍ය්‍ය" යන්නෙන් කවරෙක් ගත යුතුද යත්? වඤ්චව්‍යාකරණයෙහි කතීෘවූ චන්ද්‍රාචාය්‍ය හෙවිත් වඤ්ඤ ගොමී තෙමේම ගතයුතු වෙයි. අන්‍යයෙක් නොගත යුතුවෙයි. කුමක් හෙයින්ද යත්? වඤ්ඤ නම්න් අන්‍යාචාය්‍ය්‍යවරයකුගේ අභාව යෙනි චන්ද්‍රාචාය්‍ය්‍ය වසුරාතාචාය්‍ය්‍ය දෙදෙනා පාටලිපුත්‍ර නගරයෙහි රාජ්‍යය කළ වඤ්ඤගුප්ත රජහුගේ කාලයෙහිම විජෘම්භමාණවූ බව යට දක්වන ලදී. කාල වර්‍ණාදියද විස්තරව එහිදී දැක්වීමු. (1) මේ චන්ද්‍රාචාය්‍ය්‍යවරතෙම චඤ්ඤ, රාජවඤ්ඤ, චන්ද්‍රාචාය්‍ය්‍ය, වඤ්ඤගොමී, යන අන්‍ය නාමවලින්ද ප්‍රකටයි. මේ ආචාය්‍ය්‍යවරයන් විසින් පාණිනි ව්‍යාකරණය හා තත්භාෂ්‍යයද ඇසුරුකොටගෙන සවර්‍ණප්‍රතිහාන බලයෙන් චන්ද්‍රව්‍යාකරණය නිපදවන ලද බව වාක්‍යපදීයයෙහි "ස නීතෝ බහුශාඛත්වං චන්ද්‍රාචාය්‍ය්‍යාදිභිඃ පුනඃ"යි යන කාරිකාඛ්‍යයෙන් ස්ථිරවෙයි. මෙසේ ඇතිකල්හි චඤ්ඤ ව්‍යාකරණයයි නම් ලද මේ ව්‍යාකරණය පාණිනීය ව්‍යාකරණයට පසුව නිපදවූ බවම පැහැදිලි වෙයි. පාණිනී ව්‍යාකරණයෙහි සූත්‍ර හා චඤ්ඤව්‍යාකරණයෙහි සූත්‍රද එකිනෙකට සසඳ බැලූ විටකද විඥයකුට මේ හොඳින් වැටහී යනවා ඇති. මේ චන්ද්‍රාචාය්‍ය්‍යවරතෙම කවර රටක් හෙබවූ යේද යත්? කාශ්මීර දෙශය හෙබවූ බව මෙකල භාරත දෙශයෙහි වසන ඇතැම් ප්‍රසිඛ පණ්ඩිතවරයන්ගේ මතයි. ඊටද ප්‍රධාන හෙතුව නම් මේ චන්ද්‍රව්‍යාකරණය කාශ්මීර, නෙපාල, ටිබැට්, චීන, හොටාන, මාලව, උජ්ජයිනී ආදි ටවල වැඩියක් පැතිරීමයි. භාරත වර්‍ෂයෙහි වෙනත් රටවල හා සියම්, බුරුම, කාම්බොජ ලඞ්කා යන රටවලද බොමහෝ සේ පැතිරී පැවැත්තේය. පාණිනි ව්‍යාකරණය ලුප්තප්‍රායවූ කල්හි චඤ්ඤ ව්‍යාකරණය නොයෙක් තැන පැතිරීමට මාර්‍ගයක්ද විය. මේ චන්ද්‍රාචාය්‍ය්‍යවරයන්ට චඤ්ඤ ගොමී යන නාමය කවර හෙයකින් ව්‍යවහාරවිද යත්? චඤ්ඤ යනු ජනමාවසථාවෙහි දෙගුරුන් විසින් තබන ලද නාමයෙකි. ගොමී

---

(1) මේ චඤ්ඤගොමී තෙම ක්‍රිස්තු වර්ෂ 465 ට හා 544 ත් අතර කාලයෙක්හි මිට වර්ෂ1877 කට පෙර හයුංයාං නම් චීන යාත්‍රිකයා දිඹදිවට පැමිණි කාලයෙහි ජීවත්ව සිටියේයයි සමහර ජර්මන් පණ්ඩිතයන්ගේ මතයි.

යනු විශෙෂ ගෞරව නාමයෙකි. මෙහි ගොම් යන නාමය පූජ්‍ය භාෂයෙහි යයි ඇතැම් පණ්ඩිතයන්ගේ මතයි. සිංහල භාෂාවේ ව්‍යාකරණයවූ "සිඛාත්‍ත සංග්‍රහවෙහි" හෙවත් "සිදත් සඟරාවේ" සිංහල පදවිවරණ ව්‍යාඛ්‍යානයන්හි "ගුරුළුගොම්" "සඳගොම්" යන දෙතන්හි පූජ්‍යාර්ථයෙහි 'ගොම්'යනු නිපාතනයෙන් සිඛයයි කියා තිබේ. පූජ්‍යාර්ථයෙහි'ගොම්න්'ශබ්දයක් සංස්කෘත භාෂාවෙහි අවිද්‍යමානයි.'ගොම්න්'යනු බෞඛ මහාඋපාසකයකුටවූ ව්‍යවහාරනාමයක් බව සංස්කෘත අභිධාන කොශවල ප්‍රකටයි. ත්‍රිකාණ්ඩශෙෂ නම් අභිධාන කොශයෙහි:— 'මහොපාසක ගොම්තෙෆ" කියා අභිධානය පෙණේ. උජ්ජල දත්තවෘත්තියෙහි:— "ගුරුවෙගුණ්‍යා චිඥදනාචිඥාත්‍රගොම් ලශ්ඡාත්‍රඃ, ඥාත්‍රගොම් ඥාත්‍රොපාසකඃ"යි පෙණේ. "ගොම්ගොමානුපාසකෙ" යනු ඛරස්වාමිඛරකොශයි, "ගොම් නින්‍ද්‍ය ප්‍රශස්තයොඃ" යනු රුද්‍රකොශයි. ඥාත්‍ර ගොම්තෙෆ ඥාත්‍රගොම්නඃ යන දෙතැන ඤ්‍ණු්‍හාදි ගණ ගෙයින් ණත්වය නොවන බවද කියයි උජ්ජලදත්ත වෘත්තියෙහි මේ නිදසුන් වලින්ද පළමු අදහසම ස්ථිරවෙයි. එවිට චන්‍ද්‍රගොමී යනු චන්‍ද්‍ර නම් මහා උපාසකයෙකි (1) උපාසක යනු රත්නත්‍රය ශරණ පරායණකොට වසන බෞඛයකුටම ව්‍යවහාරවූ ගෞරව නාමයක් බව බුඛාගමේ පොත්වල ප්‍රකාශයි. මේ චන්‍ද්‍රාචාර්‍යවරතෙම හුදු බෞඛයෙක් බව මේ නාමයෙන්ම යහපත්සේ නිශ්චිත වීය

තවද චන්‍ද්‍රව්‍යාකරණ ප්‍රාරම්භයෙහි දක්වන ලද ඉෂ්ට දෙවතානුස්මරණපූර්‍වික මඞ්ගලාචරණ ශ්ලොකයෙන්ද බෞඛයෙක් බව පැහැදිලි වෙයි. ප්‍රාරම්භශ්ලොකය මෙසේය.

"සිඛං ප්‍රණම්‍ය සම්බුඛං සම්ඝියං ජගතොා ගුරුම්,
ලඝු විප්‍රපඤ්ච සම්පූර්‍ණම් මුව්‍යතෙ ශබ්ද ලක්‍ෂණම්"යි.

මේ නමස්කාර පරිදීපක ශ්ලොකයේ "සිඛම්" "සම්බුඛම්" "සම්ඝියම්" "ජගතොාගුරුම්" යන විශෙෂණ පද සහරෙන් තමා හුදු බෞඛයකු බවම් නිඃසන්දෙහවසයෙන් ප්‍රකාශකොට ප්‍රණාමය දක්වීම් ඛ බෞඛයෙක් බව හැඟීමට විශෙෂ කාරණයෙකි. මෙහි "ප්‍රණම්‍ය" යන පූර්‍වකාලවර්තී ක්‍රියා පදයෙහි "ප්‍ර" යන උපසර්ගය මුල් නොට නම්ධාතුව යෙදීමෙන්ද තමාගේ අචින්තීය ශ්‍රද්ධා භක්තාතිශය ප්‍රකාශකරයි චන්‍ද්‍රාචාර්‍යයන් විසින් විරචිතවූ "ශිෂ්‍යලෙඛ" නමැති ග්‍රන්ථයද මීට සාක්ෂිදරයි. මේ ශිෂ්‍යලෙඛ

---

(1) ඥඞ්ඛ්‍රගොම් විසින් විරචිත චාන්‍ද්‍රවෘත්තියක් ඇති බව කියයි මේ ඥඞ්ඛ්‍රගොම් ඥාත්‍රගොම්ද? ඥාත්‍රගොම් නාමයක් උජ්ජලදත්තවෘත්තියෙන් ගටදක්වන ලදී.

නමැති ග්‍රන්ථයද මීට ශාක්ෂි දරයි. මේ ශිෂ්‍යලෙඛ්‍ය ග්‍රන්ථයෙන් උපුටාගෙන ධම්ප්‍රදීපිකාවේ දක්වා තිබෙන ශ්ලෝකද බැලිය යුතුයි. චන්ද්‍රාවාය්‍යීවරයන්ගේ බෞද්ධමහොපාසකත්වය ප්‍රකාශ වීමට මේ කරුණු සැහේයයි සිතමු. මීට වැඩි යමක් කිම ප්‍රපඤ්චයි. මේ චන්ද්‍රාවාය්‍යීවරතෙම ශුද්ධ බෞද්ධයෙක් වියයි යන මේ ප්‍රතිනියම වන්නු ව්‍යාකරණය බෞද්ධ රටවල වැඩියක් ගෞරවයෙන් ප්‍රචලිත වීමට හෙතුභූතයයි සිතමු. මේ චන්නු ව්‍යාකරණය සියලු ව්‍යාකරණාඛ්‍යවලින් අත්‍යුනවම නිපදවන ලද්දකි. එහි සූත්‍ර, උණාදි, ධාතු පාඨවශයෙන් තුන් පරිද්දකින් විභාග කොට දක්වා තිබේ. අධ්‍යාය (7) සතක්ද පාද (27) සත්විස්සක්ද සූත්‍ර (3426) තුන්දහස් සාරසිය සවිස්සක්ද වෙති.

මෙසේ නාති විසතර නාති සංක්ෂෙප වශයෙන් මේ ව්‍යාකරණය නිපදවා තිබෙන පරිදි සකල විඥයන්ගේ චිත්තාභිරමණයට අතිශය හෙතුභූය, මේ චන්නුව්‍යාකරණය සම්බන්ධවද පාණිනි ව්‍යාකරණයට මෙන් පරිවාර ග්‍රන්ථ වැඩියක් කළ බව දැනගැනීමට කරුණු නොපෙණේ. මේ ව්‍යාකරණය සම්බන්ධව චන්ද්‍රාවාය්‍යීයන් විසින්ම "රතනමනිපඤ්ඤිකා" නමින් ටීකාවක් කළ බවද ප්‍රකටයි. ලක්දිව විසූ ප්‍රඥාසතර පරම ශෙමුෂි ප්‍රභාසම්පන්නලලිත අචිතීය ටීකාවාය්‍යීවූ ශාරිපුත්‍ර මහාසවාමි පාදයන්වහන්සේ විසින් මේ ටීකාව සම්බන්ධව "පඤ්ඤාලඞ්කාර" නමැති අනුටීකාවක්ද කරණලද්දේය (1) මේ අනුටීකාවත් මෙකල ලුප්තප්‍රායවියයි සිතීමට කරුණු පෙණේ. චන්ද්‍රාවාය්‍යීයන් විසින්ම "ශිෂ්‍යලෙඛ්‍ය" යන නමින් යුත් බෞද්ධ ධර්ම ග්‍රන්ථයක්ද කරණ ලද්දේය. මෙකල මේ "ශිෂ්‍යලෙඛ්‍ය" නම් ග්‍රන්ථවරය යුරොපීය රටවල හා භාරත දෙශීය රටවලද ලඛ්කාවේද විරල වශයෙන් පවත්නේය. ගුරුළුගොමින් විසින් කළ බොධිවංශ පරිකථා නම්වූ "ධම්මප්‍රදීපිකා" ග්‍රන්ථයෙහි ශිෂ්‍යලෙඛ්‍ය ග්‍රන්ථයෙන් උපුටා ගොදන ලද පද්‍ය තන්හි තන්හි දෘෂ්ටානත කොට තිබෙන්. චන්ද්‍රාවාය්‍යීයන් විසින් මේ විනා වෙන යම් කිසි ග්‍රන්ථයක් කළ බවක් ඉතිහාසාදියෙහි ප්‍රකාශ නොවිය. එසේ ඇත්නම් ඒ ගුප්තයයි හැගේ.

---

(1) චාන්ද්‍ර පඤ්ඤිකාව ලක්දිව උපන් පණ්ඩිතරත්න ශ්‍රී ඥාන භික්ෂූන්වහන්සේ විසින් කළ බව කියයි. ඒම භික්ෂූන්වහන්සේ පසුකලක දඹදිවට වැඩ භූතණ කිත්තිරාජ නම් බෞද්ධ රජෙකුගේ පුත්‍ර කුමාරාදීන් විසින් පුදන ලදුව එහි විසූ බෑව් මුන්වහන්සේ විසින්ම කළ සංසකෘතශ්ලොකාවලින් යුත් දඹදිව මධ්‍යමණ්ඩලයේ බොධිසථානයෙහි පිහිටුවා තුබූ ශිලාලෙඛන ප්‍රවෘත්තියෙන් සැලකිය හැකියි.

අප විසින් මේ පුරාවෘත්ත කථනයෙහිදී භාරතදෙශයෙහි විසූ යශොමූර්ති විජෘම්භිත ප්‍රසිඩ පණ්ඩිතවරුන් කීපදෙනෙකුන් ගේ මතාවලම්බනය කරණ ලද්දේ වුවත් කලිකතා නගරයෙහි බෙඞ්ගාලේ රාජකීය සංස්කෘත විද්‍යාමන්දිරයෙහි ප්‍රධානාචාර්‍යවිසූ දෙශදෙශාන්තර ප්‍රචලිත කීර්ත්‍යභිධම්බයෙන් සමුජ්ජ්වලිත අසම්දෘචාර්‍යභූත ශ්‍රී තාරානාථ තර්කවාචස්පති භට්ටාචාර්‍ය බ්‍රාහ්මණ පණ්ඩිතුමාගේ මත වැඩියක් ගරුතන්හි තබා සම්භාවනා කරණ ලද්දහ.

බාලාවබොධන නම් ව්‍යාකරණ ග්‍රන්ථය.

මේ වඤ්චු ව්‍යාකරණය භාරතදෙශයෙහි හා ලක්දිවද ව්‍යාප්තව නිරූපද්‍රුතව පවත්නා කල්හි ශ්‍රී බුඞ්ධ වර්ෂ 1739 යේදී හෙවත් මීට හාර්‍රුදු 728 කට පූර්වයෙහි පුලස්ති පුරයෙහි හෙවත් පොලොන්නරුවේ අග්‍රරාජධානිය කොට ලක්දිව එක්සේසත් නගා රාජ්‍ය පරිපාලනය කළාවූ කලිකාල සාහිත්‍ය සම්වඤ්ඡ පණ්ඩිත පරාක්‍රම බාහු නරශ්‍රේෂ්ඨයන්ගේ කාලයෙහි ඒ නරශ්‍රේෂ්ඨයන් විසින් තුන් නිකාය සමඞ්ගි කොට සරවන ලද ශාසන ශුද්ධියෙහිදී පවා මහා සඞ්ඝයාගේ අග්‍රෙසර භාවයෙන් ශාසනික යහපත් කටයුතු සඳහා සියලු ආධාරකළාවූද තත්කාලයෙහි ලක්දිව සංඝරාජ පදප්‍රාප්ත වූද ත්‍රිපිටක පර්‍යාප්තිය සහිත සකල ශාස්තෘශාසන භාරධාරිවූද ව්‍යාකරණ, නිරුක්ති, ඡන්දස් අලඞ්කාර, ජ්‍යොතිෂ, න්‍යාය, සම්‍රෘති, සාඞ්ඛ්‍ය වෛශෙෂිකාදි ශාස්ත්‍රාන්තර පාරාවතරණය කළාවූද ශීල, සමාධි, ප්‍රඥා, කරුණා, මෛත්‍ර්‍යාදි අපර්‍යන්ත ගුණගණාඞ්ග සඤ්චයවූද දීඝ්‍රිලාගල භදන්ත මහාකාශ්‍යප සංඝරාජ මහාස්ථවිරපාදයන් වහන්සේ විසින් පූර්වයෙහි වරද රාජයන් විසින් පාණිනී ව්‍යාකරණය අළලා පාණිනි ව්‍යාකරණයෙහි පරිවාර ග්‍රන්ථයන්වූ "මධ්‍යතෙඅමුදි" ලඝුතෙඅමුදි නමැති ප්‍රශස්ත ග්‍රන්ථයන් කළ පරිද්දෙන් චන්‍රව්‍යාකරණය අළලා චන්‍ර ව්‍යාකරණයෙහි පරිවාර ග්‍රන්ථයක්වූ "බාලාවබොධන" නම් මේ ප්‍රශස්තතර ග්‍රන්ථරත්නය නිර්මාණය කරණ ලද්දේය.

මේ ශ්‍රීමත් මහාකාශ්‍යප සඞ්ඝරාජ මහාස්ථවිරපාදයන් වහන්සේ පිළිබඳව ශාරිපුත්‍ර මහාස්වාමීන් වහන්සේවිසින් අඞ්ගුත්තර ටීකාවෙහිද මෙසේ දක්වන ලදී:—

උළාරපුඤ්ඤතෙජෙන සාඛා සත්ථුවිම්හදනං,
පත්තරජ්ජාභිසෙකෙන සාසනජෝතනත්ථිනා.

නිස්සාය සීහලින්දේන යං පරක්කමබාහුනා,
කත්වා නිකායසාමග්ගිං සාසනං සුවිසෝධිතං.

කස්සපත්තං මහා ථේරං සඞ්ඝස්ස පරිණායකං,
දීපසම්ං තම්බපණ්ණිම්හි සාසනොදය කාරිනං.

පච්චත්තිපරාධිනං සද්ධරම්මනිවාසිනං,
පාකටං ගගනෙ චන්දමණ්ඩලං විය සාසනෙ.

සීඛ්‍යස්ස පිතරං වන්දෙ විනයෙසු විසාරදං,
යං නිස්සාය වසන්තෝ'හං වුඩ්ඪපත්තොස්මි සාසනෙ.

අනුථේරං මහාපුඤ්ඤං සුමෙධසුනිවිස්සුතං,
අවිඛණ්ඩි තසීලාදි පරිපුණ්ණගුණොදයං.

බහුස්සුතං සතිමන්තං දන්තං සන්තං සමාහිතං,
නමාමි සිරසා නිරං ගරුං මෙ ගණවාචකං. සී

මේ ග්‍රන්ථරත්නයද තත්කාලයෙහි ලක්දිව නානාප්‍රදෙශයන්හි උද්දීපනව විශෙෂයෙන් පැතිර පැවැත්තේය. ලක්දිව් වැසි විද්‍යුත් ලාෂි සබාල සාධූන්ගේ ඤානාභිවඩ්ඪනය හා ඉෂ්ටාර්ථ සාධන යද ඔහපත්සේ සලසාලිමෙන් සිහුම්ණි රැවනක් සේ විජෘම්භිත වීය. බාලාවබොධන නම් මේ වන්ද්‍ර ව්‍යාකරණ ග්‍රන්ථයද සන්ධි, සුබන්ත, ඒකාර්ථ්‍ය, අණාදි, තව්‍යාදි, නිබන්ත, යන කාණ්ඩ සයකින් විභාගකොට විද්‍යුත්වූ ආධුනිකයන්ගේ සුඛාවබොධයට සුදුසු පරිදි නාති විස්තර නාති සංක්ෂෙප වශයෙන්ම කරණ ලද්දේය. මේ ග්‍රන්ථවරයද ඒ කාලයෙහි සංසකෘත ව්‍යාකරණාභිලාෂි ගෘහස්ථ ප්‍රව්‍රජිත වැඩිදෙනෙකුන් විසින් ගෞරව සම්භාවනා පුරඃසර කොට සමාදරයෙන් උද්ග්‍රහණ ධාරණ පරිශීලනාදිය කරණ ලද බවද පෙණේ. පුරාතන ලක්දිව නිපදවූ ඇම් යම් සිංහල පදවී ව්‍යාඛ්‍යාන ගැටපද විවරණාදියෙහි පදසිද්ධි දැක්වීමේදී වන්ද්‍ර ව්‍යාකරණ සූත්‍රම බොහෝසේ දෘෂ්ටානුසාර තිබීම වන්ද්‍රව්‍යාකරණයම වැනියක් පරිශීලනය කළ බවට වැදගත් ඥාපකයෙකි. පසු කාලය කදී මේ ප්‍රශස්තතර ග්‍රන්ථවරයට ඒ කාලයෙහි විසූ යම්කිසි සුධිවරයකු විසින් සිංහල පදවී ව්‍යාඛ්‍යානයක්ද කරණ ලද බව පෙණෙනවා පමණක් විනා ඒ සුධීවරයා විසූ ස්ථානයක් වත් ඔහුගේ නාමය වත් නොදක්නා ලද්දේය.

මෙසේ මේ වන්ද්‍රව්‍යාකරණය භාරතදෙශයෙහි හා ලක්දිවද බොහෝ කලක් ව්‍යාප්තව පවත්නා කල්හි ලෝවැස්සන්ගේ පෙර කළාවූ අකුශලකම් විපාකයකින්දෝ නැතහොත් ආලස්‍ය දූෂ

යෙන්දෑ උදේග්‍රහණධාරණාදියෙහි මනුදරව්ම හෙතුකොට ගෙන චන්ද්‍රව්‍යාකරණයත් ලුප්තප්‍රාය බවට පැමිණියේය. ශතවර්ෂ ගණනකින් මොබ්බෙහි මේ ව්‍යාකරණය සම්බන්ධ ඉගණීමක් තබා ග්‍රන්ථ මාත්‍රයකුදු සපයාගැනීම නොහැකිවිය.

නැවතත් චන්ද්‍රව්‍යාකරණයාගේ පහළවීම.

මෙසේ බොහෝ කාලයක් ඉක්ම ගියාට පසු නැවත ශාසන වර්ධනයට ආරම්භවූ කාලයෙහි හෙවත් මීට ශතවර්ෂයකට පමණ පෙර ඉංග්‍රීසි ආණ්ඩුවේ මෙහෙයිමෙන් භාරත වර්ෂයෙහි පුරාණ වස්තු පරීක්ෂණයෙහි නියුක්ත සමිතියේ මහතුන් විසින් භාරත දේශයෙහි නාලන්ද නම් ග්‍රාමයෙහි පුරාණ පුස්තකාලයක තිබී චන්ද්‍ර ව්‍යාකරණය සම්බන්ධ "මූලග්‍රන්ථවරය" හා "මාධ්‍යමිකාවෘත්ති" නමැති මෙහාල සැපයිමට අභිශය දුර්ලභ වැදගත් බෞද්ධ ග්‍රන්ථකිපයක් සපයා ගන්නා ලද්දේය. මේ "මාධ්‍යමිකාවෘත්තිය" බෞද්ධ ධර්ම විස්තර වශයෙන් දක්වන "විශුද්ධිමාර්ගය"වැනි ග්‍රන්ථවරයෙකි. මේ ග්‍රන්ථය අපේ මෙහෙයිමත් ඇතිව දැනට ඉන්දියාවේ නාගරාක්ෂරයෙන් මුද්‍රණය නොට තිබේ. මේ චන්ද්‍රව්‍යාකරණයේ පොත් කැබලි කිපයක් ටිබැට් රටින් හා නේපාලයෙන්ද වෙනත් ඵලාත් කිපයකින්ද ඉතා උත්සාහයෙන් නැවත සපයාගෙන තිබේ. භාරත වර්ෂයෙහි මේ නාලන්ද ග්‍රාමය වර්තමානයෙහි මගධ රටෙහි "බිහාර්" ජනපදයට දකුණු දිහින් බුද්ධගයාවට හෙවත් මහ බෝමැඩට නානි දුරයෙහිම පිහිටි ඉතා ප්‍රසිද්ධයක් ඉසුලූ ස්ථානයෙකි. සම්බුදුරජාණන්වහන්සේ ධර්මාන කාලයෙහි වරින් වර මෙහි වැඩවිසූ බවද බෞද්ධ ග්‍රන්ථවල ප්‍රකාශව තිබේ. සම්බුදුරජාණන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවකවූ ශාරිපුත්‍ර මහරහතුන් වහන්සේගේ ජන්මභූමියත් මෙහිම වීය. "හත්‍ථසාං" නම් චීන වන්දනාකාර භික්ෂුවද කලක් මෙහි විසූ බව ඔහුගේ ගමන් විස්තරයේ සඳහන්කොට තිබේ. මේ නාලන්දුවෙහි පුරාතන බෞද්ධ නරපතීන්ගේ කාලයෙහි හෙවත් මීට වර්ෂ දහසකට පෙර "ශක්‍රාදිත්‍ය" නරශ්‍රේෂ්ඨයන්ගේ පුත්‍රවූ "බුද්ධගුප්ත" රජතෙම මහා විහාරයක් කරවීමට ආරම්භ කෙළේය. මේ මහා විහාරය ඇතා ක්‍රමයෙන් මහත් දිවුණුවට පැමිණියේය. මේ රජහුගේ පුත්‍ර පෞත්‍රාදි පරම්පරාවෙන් වඩ වඩාත් දිවුණු කොට තණ්හාසහ රජහුගේ කාලය අවසානය දක්වා ඉහාම සම්බුදුව පැවැත්තේය. මෙහි ප්‍රවෘත්තිය අති විස්තරයි. ඊට ප්‍රපඤ්ච නොවෙමු. මේ මහා විහාරයෙහි පූර්වදිග ශාසන සම්බන්ධව ලොකප්‍රසිද්ධ විශ්ව විද්‍යාලයක්ද පිහිටුවා තුබුණේය. මෙහිදු දෙසිය

කට වැඩියක් බෞද්ධ භික්ෂූහු ආචාර්‍යාධිපති දැරූහයි ප්‍රකාශව තිබේ, මේ විද්‍යාමන්දිරයෙහි නිතර ගෘහයෝ ප්‍රව්‍රජිත ශිෂ්‍ය සමූහයා දස දහසකට වැඩිතරම් මහත් පිරිසක් පාලි, සංස්කෘත, න්‍යායාලඞ්කාරාදි නානා ශාස්ත්‍ර හා භාෂා හා ධර්ම්මවිනයාදිය උද්ග්‍රහණය කෙළේයයි සඳහන්ව තිබේ. තත්කාලයෙහි විසූ බෞද්ධ නරපතීන් විසින් මේ විද්‍යාමන්දිරයෙහි සංරක්ෂණය හා පාලනය පිළිබඳව නොයෙක් විධිවිධානාදියද මනාව කරවන ලද්දේය. මේ විද්‍යාමන්දිරය වනාහි තත්කාලයෙහි භාරත දෙශයෙහි නානා ප්‍රදෙශවල හා ප්‍රත්‍යන්තරවලද බෞද්ධ ධර්ම්ම වර්ධනයට අත්‍ය නෙතාපකාරීවූ මහතු සිතුම්ණක්සේ ලියයි ඉතිහාස ග්‍රන්ථවල බෙහෙවින් වර්ණනාකර තිබේ. මේ විද්‍යාමන්දිරය සම්බන්ධව ඒ කාලයෙහි විශාල පුස්තකාලයක්ද එහිම පිහිටුවා තුබුණේය. මේ පුස්තකාලය භූමිගර්භයෙහි අඩි දහසකටත් වැඩිතරම් යට භූමිය සාරා දිගින් හා පුලුලින්ද ඊට සුදුසු ප්‍රමාණවත් භූමි ගෘහයක් කොට දක්ෂ ශිල්පීන් ලවා මටසිලුටු කොට කප්පවනලද ප්‍රස්තර පදරඟන් හෙවත් කලුගල්ලෑලි එකිනෙකට මනාසේ අතුරුවා යහපත් දශීනීය ආකාරයකින්ම ඒ පුස්තකාලය කරවන ලද්දේය. මෙහි අන්තර්ගත කරණලද පුස්තකාදියට ගිනි, ජල, වායු යන මෙයින් හා කීට මූෂිකාදි දුෂ්ට සත්ත්වයන්ගෙන්ද කිසි ලෙසකින් උපද්‍රව නොපැමිණෙන පරිද්දෙන් මනා සංරක්ෂණ විධියකින්ම මේ පුස්තකාලය සජීවිකෘතකරවන ලද්දේය. තත්කාලයෙහි ලොව පැවති ශාස්ත්‍ර සම්බන්ධවූ සියලු පුස්තකයන් හා බෞද්ධ ධර්ම්ම සම්බන්ධවූ පුස්තකයන්ද මේ පුස්තකාලයෙහි සුරක්ෂිතව තැන්පත් කොට තුබූ බවද ඉතිහාස ග්‍රන්ථවල ප්‍රකාශව තිබේ. මේ පුස්තකාලයේ තිබී චන්ද්‍රව්‍යාකරණයේ මුල් ග්‍රන්ථයවූ "ශබ්දලක්ෂණය" සපයාගත්තාට පසු මේ ප්‍රශස්තතර චන්ද්‍රව්‍යාකරණය නැවතත් ලොව පැතිරීමට ආරම්භවිය.

වර්තමාන කාලයෙහි චන්ද්‍රව්‍යාකරණයට අයත් "බාලාවබෝධන" නමැති මේ ග්‍රන්ථවරය හා තද්ව්‍යාඛ්‍යානයවූ සිංහල පද්‍ය සන්නයත් ලක්දිව සුලභකොට විද්‍යුල්ලාභීන්ට ආධාරයක් කරලීම යෙහෙකැයි අපිදු සැලකුවෙමු. මෙසේ සලකා මේ පුස්තකාවය සෙවීම පිණිස ලක්දිව උඩපහත දෙරටෙහි නොයෙක් තැන පුරාතන ප්‍රසිඩ විහාරාරාමඥන්හි හා පුස්තකාගාරයන්හිද හවිරුදු ගණනක්ම ඉතා උත්සාහයෙන් සෙවීමු. මෙසේ සොයන අතර ඉතා අමාරුවෙන් "බාලාවබෝධන" පිටපත් සතරක් හා තද්ව්‍යාඛ්‍යානයෙන් කුඩා කැබලි දෙකක්ද සපයාගත්තෙමු. ඒ පොත්

පරිසෘවෙන් බැලූකල්හි පළමු පැවති උත්සාහවත්වූ සිත අඩුවීමට හෙතුවිය. මේ සඳහා නැවත නැවතත් උත්සාහ වැඩීම සුදුසුයයි සැලකොට පොත් සොයනවිට කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන් වැසි රඹුක්පොත (1) පඤ්ඤාසාර සථවිරයන් විසින් මහා සථවිරතුමන් කිපදෙනෙකුන්ගේ සහායයත් ඇතිව සකස් කොට මුද්‍රණය කරවනලද බාලාවබොධනයේ පිටපතක්ද ලැබී බැලූවෙමු. ඒ පොතද අපේ උත්සාහය වැඩීමට හෙතු නොවිය. මෙබඳු යහපත් කටයුත්තක් පිණිස උත්සාහ වඩා ඒ කටයුත්ත මුදුන් පමුණුවා ලිම සියස්වත් සාධුන්ගේ සචරිත්‍රයක් බව "වණ්ණුපථ" ජාතකාදි උත්තම ධර්ම මාගීානුසමරණය කිරීමෙන් වැඩියක් ධෛයී උපදවා නැවතත් මේ යහපත් කෘත්‍යය පිණිස අනල්ප පරිශ්‍රම දැරීමට තදින් සිතුවහන් කෙළෙමු. මේ පොත් සෙවීමේදී අපට ලැබුණු සියලුම බාලාවබොධන පිටපත් වරදින් ගහනවූ ආකුලවූ තන්හි තන්හි කොටස් අඩුවූ පොත් බව මෙහිදී කිමට පවා කැනගාට්ට ඇත්තෙමු. එකී පොත්වල තුබූ සූත්‍ර වැඩි යක්ම චන්ද්‍රාවායස්ථවිරයන්ගේ මතයට ඉදුරාම ප්‍රතිවිරුද්ධලෙස යොදා තුබුණේය. ඒවා චන්ද්‍රව්‍යාකරණ සම්බන්ධ සූත්‍රද අන්‍ය ව්‍යාකරණයකට අයත් සූත්‍රදැයි තේරුම්ගැනීමට පවා ඉතා දුෂ්කරව තුබුණේය. නාම, සමාස, කෘත් යන කාණ්ඩත්‍රයෙහි බොහෝ තැන් අභාවයට පත්වී ඌනව තුබුණේය. අපට ලැබුණු සිංහල පදවී ව්‍යාඛ්‍යාන කාණ්ඩ දෙකේම සඤ්ඤාකාණ්ඩය පටන් නාම කාණ්ඩය දක්වා කොටසක්ද සමාස කාණ්ඩයෙන් කොටසක්ද කෘත් කාණ්ඩයෙන් සවළුපයක්ද තුබුණේය. අනිත් සියලු පදවී ව්‍යාඛ්‍යානද විනාශහාක් වී තුබුණේය. එහි ශෙෂවී තුබුණු කාණ්ඩ කියවාගන්වී පවා බැරිතරම් ලෙස ආකුලව්‍යාකුලව පැවැත්තේය. මීට පසුව නොයෙක් පලාත්වල නොයෙක් පරිදිදෙන් මේ පොත් දෙකේ පිටපත් සෙව් නුමුත් සිංහල පදවී ව්‍යාඛ්‍යානය සම්බන්ධව මීට වැඩිපොතක් සපයාගැනීමට නොහැකිවිය. මේ පොත් සෙවීම් සම්බන්ධව කල්‍රුදු ගණනක්ම කාලය ගත කරන්ට වීම නියා කාලයද නිෂ්ඵලවිය. මෙහිදී මීට වඩා සම්පූර්ණවූද ශුද්ධවූද පොත්පත් ලබාගැනීම නොහැකියයි නිශ්චයටද පත්වීමු. කෙසේ නුමුත් පටන්ගත් ලොකාර්ථයි මේ යහපත් කටයුත්ත මුදුන් පමුණුවා ලීමට පරිශ්‍රම දරන්ට තදින් නිශ්චය කරගත් තෙමු චන්ද්‍ර ව්‍යාකරණාශ්‍රයෙන් හා සමගර තැනකදී පාණිනී

---

(1) දැනට මේ සථවිරයෝ ශ්‍රීපාදසථානයේ නාගකපදවිය දරති.

ශාකටායන කාතන්ත්‍ර හෙමචන්ද්‍ර යන අන්‍ය ව්‍යාකරණයන් ඇසුරු කිරීමෙන්ද පළමුකොට "බාලාවබොධන" පෙළ පොත හා ගැළපෙනසේ පුරාණ පදවිච්ඡේදාදී ව්‍යාඛ්‍යානයෙන් අපට ලැබී තුබුණු කොටස් ලිපිකරුවන්ගෙන් පැමිණි දෙස් නිරාකරණය කොට සුදුසු තැන්වලට ගැළපීමු. අඩුවී තුබූ සෙසු සියලු සිංහල පදවිච්ඡේදාදී ව්‍යාඛ්‍යාන අවි නොපිරිහෙන පරිද්දෙන් මනා පරීක්ෂාවෙන් යුක්තව අපගේ විසින්ම ලියන ලදුව සිංහල පදවිච්ඡේදාදී ව්‍යාඛ්‍යානයද සම්පූර්ණ කෙළෙමු. මේ බාලාවබොධනයෙහි පාඨශෝධනය කිරීමටත් අඩුවූ පාඨ පිරවීමටත් සිංහල පදවිච්ඡේදාදී ව්‍යාඛ්‍යානය ලියා සම්පූර්ණ කිරීමටත් අප විසින් දරණලද මහත් පරිශ්‍රම ගැන මෙහි වැඩිදුරට කරුණු ප්‍රකාශනොකළාට මේ පොතක් රැගෙන පරණ පිටපතක් හා සසඳා පරීක්ෂාකාරීව බලන්නාවූ විද්‍යාරසික සුධීවරයන්ට මනාව වැටහෙනවා ඇති.

තවද පෙර කාලයෙහි කච්චායන ව්‍යාකරණයේ පරිවාර ග්‍රන්ථයක්වූ "බාලාවතාර" නමැති ප්‍රශස්තතර ග්‍රන්ථයද තන්හි තන්හි බාලාවබොධනයේ ක්‍රමානුසාරීවන පරිද්දෙන් භදන්ත ධම්මකිත්ති පාදයන් විසින් රචනා කරණලද බව විඥයන්ට මනාව වැටහී යනවා ඇති. මොග්ගල්ලායන ව්‍යාකරණයට අයත් පදසාධනයෙහිද මෙසේ ඇති. මේ නිසා කච්චායන ව්‍යාකරණය පරිශීලනය කරන්නවුන් විසින්ද මොග්ගල්ලායන ව්‍යාකරණය පරිශීලනය කරන්නවුන් විසින්ද සංඝරාත ව්‍යාකරණ ඉගෙණීම පිණිස පළමු කොට චන්ද්‍රව්‍යාකරණයද පරිශීලනය කිරීම ඉතා යොගය බැව් කියමු. මේ බාලාවබොධනය ලක්දිව ප්‍රචලිත මහත් කීර්තියක් ඉසුලූ මහා සංඝරාජ උතුමෙකුගේ කෘතියක් හෙයින්ද මුල් චන්ද්‍රව්‍යාකරණයත් බෞද්ධ පණ්ඩිතොත්තමයකුගේ කෘතියක් හෙයින්ද මේ චන්ද්‍රව්‍යාකරණයම බෞද්ධ විද්‍යාර්ථීන්විසින් ගරුසමහා වනා සහිතව පරිශීලනය කිරීම හැම ලෙසින්ම යොගය්‍යවෙයි. පළමුකොට මේ බාලාවබොධනය පරිශීලනය කළවිට පසුව මුල් චන්ද්‍රව්‍යාකරණය ප්‍රභුණුකිරීමටද හැකිවන්නේය. යම් ලෙසකින් කාලයෙන් හෝ රොගපීඩාදි විපත්තියකින් හෝ අපට බාධාවක් නොපැමිණියහොත් වැඩිකල් ගතවෙන්ට මත්තෙන්ම සම්පූර්ණ චන්ද්‍රව්‍යාකරණ ග්‍රන්ථය නිරායාශයෙන් විද්‍යාර්ථීන්ගේ හස්තප්‍රාප්ත කිරීමට දොස්සාහී වන්නෙමු.

තවද කියයුත්තක් ඇති. පාණිනි ව්‍යාකරණය ලොකයෙහි පවත්නා ව්‍යාකරණයන් අතුරෙන් අග්‍රගර ශ්‍රේෂ්ඨ ව්‍යාකරණයක් බවම පළමු ප්‍රකාශ කෙළෙමු. එසේ වුවත් ඒ ව්‍යාකරණය

වෛදික මතානුසාරී මහර්ෂීන් විසින් නිපදවන්ලදද්කි, මේසේ තිබියදී පෙරනල හෙවත් මීට වඩි 1716 කට ඔබ්බෙහි ලක්දිව විසූ ශුද්ධ බෞද්ධ පණ්ඩිතවරයෙක්වූ මහා වෛයාකරණාචාර්‍ය්‍ය ධම්ම කිත්ති පාදයන් විසින් පාණිනිව්‍යාකරණය අළලා "රූපාවතාර" නමැති අවිතිය ප්‍රසස්තතර ග්‍රන්ථරත්නයක් නිපදවන ලද්දේය. එය විද්වාර්ජීන්ගේ සුබාවබොධය සහපත්ව කරවනුපිණිස මනාවිදී වෙළඹින් ගළපන ලද්දේය. පාණිනි ව්‍යාකරණ පුහුණු කරනු කැමැති විද්වජීන් විසින් මේ ග්‍රන්ථවරය පරිශීලනය කිරීමත් වැඩියක් සුදුසුව තිබේ. එවිට ලක්දිව ශුද්ධ බෞද්ධ පණ්ඩිතවරයන් විසින් නිපදවනලද පාණිනී චන්ද්‍රව්‍යාකරණ ග්‍රන්ථවයම පරිශීලන යට පුරුදු විය හැකිසි

කෘතගුණ සැලකීම.

මේ පොත සකස් කොට සම්පාදනය කිරීමේදී මහනුවර ඒ. ඇම්. ඇස්. බණ්ඩාරම්හත්මයා විසින් ශ්‍රී වර්ධන පුරයෙහි රාජකීය ප්‍රාචීන ප්‍රස්තකාගාරයෙහි අධ්‍යක්ෂධුරය දරණ ගලගෙදර අප හිතෛෂී ආයුෂ්මත් ගුණරතන සථවිරයන්ගෙන් 'බාලාවබෝධන' සිංහල පදවී ව්‍යාඛ්‍යාන කාණ්ඩයක් ලබාදීමෙන් අපට විශෙෂ ආධාර කරණ ලද්දේය. කෘතඥ ගුණ සැලකීම් වශයෙන් ඒබව මෙහි සඳහන් කොට ඒ මහතාට සතුතිකරමු. වෙනත් භවතුන් කිපදෙනෙකුත් විසින්ද "බාලාවබෝධන" පිටපත් තුණක් සපයා දීමෙන් අපට ආධාර කරණ ලද්දේය. ඒ භවතුන්වදද අපි සතුති කරමු. මේ පොත මුද්‍රණයේදී මට අවකාශ පහසු නොමැති දින වල මගේ ශිෂ්‍යයෙක්වූ මහනුවර සොණුත්තර තැන විසින් ශුද්ධි පත්‍ර බලා සකස්කර දීමෙන් මට ආධාරකළ බවද කෘතගුණ සැලකීම් වශයෙන් මෙහි සඳහන් කරමු.

ලොකාර්ථ සිද්ධිය පරමාර්ථකොට මේ පොත මුද්‍රණයෙන් පතළ කරවීමට අලුත්ගම සද්ධර්මප්‍රකාශ මුද්‍රාය ාත්‍රාලයේ අධිකාර අප හිතෛෂී සැදුහැවත් **කෝ. බී. ජේ. ගුණතුඩහ අප්පුහාමි** ඉතා ඕනෑකමින් ඉල්ලාසිටි හෙයින් මේ වර මේ පොත මුද්‍රණයෙන් පතළකිරීමට ඒ අප්පුහාමිට සතුටින් බාරකෙළෙමු. පොතෙන් කොටසක් පමණ මුද්‍රණය කරවාගෙන යන අතර ගදිස්සියෙන් හවගත් රොගයකින් ඒ අප්පුහාමිනිධනප්‍රාප්තවිය. අහොඛෙදයකි! නැවතත් ගුණතුඩහ අප්පුහාමිගේ ශිෂ්‍යයෙක්වූ ඇම්. ජී. ඩී. නෝරිස් අප්පුහාමිගේ උත්සාහයෙන් පොතේ මුද්‍රණය අවසාන

කරදෙන්ට ලැබීම අපට මහත් ප්‍රීතියක්වූ බවද කියමු. දෙවනු මේ පොතේ මුද්‍රණය කරණුවාරයක අපගේ අවසරය පරිදි දෙන්ම කළයුතු බවද මෙහි සඳහන් කරමු.

තවද විද්‍යුරසිකවූ ආධුනිකයන් විසින් බොහෝ ග්‍රන්ථ සමූහයක් හා ඉතිහාසාදියත් ඉතා පරිශ්‍රම දරා කාලයක්ම බලා ඉගෙණිය යුතුවූ පුරාතන වැදගත් කරුණු රැසක් නිරායාසයෙන්ම ඉගෙණීමට පිටිවහල්වන පරිදිදෙන් මේ සංඥපඨය ලොකාර්ථසිද්ධිය පරීම කොට වැනියක් විසතරවශයෙන් ලිවෙමු. භාරත දෙශයෙහි කිත්තිමත් ලෙස විසූ අප හිතෛෂී පණ්ඩිතවරයන් කීපදෙනෙකුන්ගේ මතදසමහර තැනසදී මීට ඉවහල් කරගතිමු. මෙහි අපේ ප්‍රමාදයකින් හෝ මතිභ්‍රමයකින් පැමිණි යම් දෙසක් විද්‍යමානවීනම් පාරාර්ථකාමීවූ සරුණාද්‍රසිත් ඇති පණ්ඩිතවරයෝ ඊට සමාධිපරවශ වෙත්වායයි අපගේ ඉෂ්ටාශංසනයයි. අපගේ මේ ව්‍යාපාරයද විද්‍යුතිලාෂී ආධුනිකයන්ට වැඩපිණිස පවතීවා යනු අපගේ අභිෂ්ටාර්ථශංසනායයි.

"සුදසසංවජ්ජමත්තෙසුදසං අත්තනෝ පන දුද්දසං,
පරෙසං හි සෝ වජ්ජානි ඔපුණාති යථා භුසං.
අත්තනෝ පන ඡාදෙති කලිංව කිතවා සඨෝ."

"නමිත්තසරාඃ සුකානිනඃ බලිං යෙ විවිත්‍ය
කණේ ගුණස්‍ය කණමපත්‍යවතංසයන්ති,
යෙෂාං මනෝ න රමතෙ පරදොෂවාදෙ
තෙ කෙචිදෙව විරලා භුවි සංචරන්ති."

"කාව්‍යෙ භව්‍යතමෝ'පි ජිඥතිවහෙරාසවාදෘමානෙමුහු
දොෂාන්වෙෂණමෙව මත්සරජුෂාං නෙසර්ගසිද්ධොදුර්හ්‍රහඃ,
කාසාරෙ'පි විකාශි පඞ්කජ එයෙ ඛෙලන්මරාලෙ පුනඃ
ක්‍රෞඤ්චශ්චඤ්චුපුටෙන කුඤ්චිතවපුඃ ශම්බූකමන්වෙෂතෙ.

ගුරුභ්‍යා නමඃ

ශිවමස්තු සර්වජගතඃ.

මිට-පරාර්ථකාමී,

C. A. Sri Seelaskhandha
C. H. P.

ශ්‍රී: බු: ව: 2468
ක්‍රි: ව: 1924 ජනවාරි මස 1 වෙනි දින
දෙඩන්දූවේ ශෛලබිම්බාරාම
මහාවිහාරයේදීය.

ශ්‍රීඃ.

සන්නසහිත

බාලාවබොධනය.

නමස්කෘත්‍යෙම
භගවතෙ'හිතෙ සම්‍යක්සම්බුද්ධාය.

1 භගවන්තං ජගදවන්ද්‍ය මගිවන්ද්‍ය තථාගතම්,
බාලාවබොධනං 1 බින්දු සඳ්ධාඤ්ඣිඤ්ඤ කරොම්‍යහම්.

*(1) අඉඋණ්, (2) යෘකක්, 3) එඔඞ්,(4)ඒඕඈච්,(5)හයවරලණ්, (6) ඤමඬණනම්, (7) ඣභඦ්, (8) ඝසධළ්, (9) ජබගඩදශ්, (10) ඛඵඡඨථඵවටතව්, (11) කපය්, (12) ශෂසර්, (13) හල්.

නමඃ ශාක්‍යසිංහාය.

ප්‍රණිපත්‍ය ජගද්ගුරුං ගරිෂ්ඨං
සුගතං ශාක්‍යමුනිං සුරෙන්ද්‍රවන්ද්‍යම්,
ශිශුවර්‍ගී සමග්‍ර බුඩ්වාබ්‍ධෝ
ක්‍රියතෙ සම්ප්‍රති තව්බොධිනී'යම්.

"තථාගතම් අභිවන්ද්‍ය අහං බාලාවබොධනං කරොමි" යනු මෙහි ක්‍රියාකාරක පදසම්බන්ධයි.

කිමහුතම්? කුමකින් විශිෂ්ටවූ සම්‍යක්සම්බුඩ සම්ඵරාජොත්තම යන්වහන්සේදයත්?

භගවන්තම්, එසේවුවත් ප්‍රණ්‍යාදි ෂාඩ්ගුණ්‍යයෙන් යුක්තවූ; ජගද්වන්ද්‍යම්, සඛගීමනීය්‍යපාතාලසඞ්ඛ්‍යාත භුවනත්‍රයවාසීන් විසින් වැන්ද යුතුවූ; තථාගතම්, සම්‍යක්සම්බුඩසම්ඵරාජොත්තමයන්වහන්සේ;

---

1 බින්දුශබ්දය සංස්කෘත භාෂාවෙහි ක්ලිවලිඞ්ගනිපාතයයි ඇතැම්අය සලකති. ඒ ව්‍යාකරණානුගත නොවේ. සංස්කෘත භාෂාවෙහි බින්දු ශබ්දය පුල්ලිංගුබව ප්‍රකටයි **විඳුඃ විඳුඃ** යනු පාණිනීය සූත්‍රයි. **වාන්විදිඅඛඝමව** විඳුඃ යනු සිද්ධාන්ත කෞමුදියි. **පෘෂතනි බින්දුඃඝතාඃ ප්‍රුම්සෝ විප්‍රුෂඃ සන්තාම් සනු අම්බරංකොඝයි. විඳු දීනනඃඝකානනරෙ** යනු මෙදිනීකොෂයි. **විඳුදිනෙච්ඡදෙයි ඝ්‍යාන්** යනු විශ්වප්‍රකාශයි. යන මේ පුරාතන ශෙෂපාඨවල බින්දුඃ කියා පුල්ලිංගුව ප්‍රකටවම නිබ්බෙනබැව් බැලියයුතුයි.

*සමහරබාලාවබොධන පිටපත්හි "හයවරට්" "ලණ්" යි සූත්‍ර දෙනක් කොට චන්ද්‍රව්‍යාකරණයෙහි ප්‍රත්‍යාහාරසූත්‍ර තුදුසක්දක්වති

ඉති ප්‍රත්‍යාහාරඃ.

2 විසර්ජනීය ජිහ්වාමූලීයෝ පාධ්මානීයානුසාරාණාං ප්‍රත්‍යාහාර කායෂු සමාවාදි භාතිඃදේශඃ, දිඞ්ආදිග්‍රහණං ජාතිනිර්දේශාත්; හකාරා දිඞ්මාත්‍රාර උච්චාරණාර්ථඃ, හකාරස්‍ය පුනඃ පාඨෝ වල්ග්‍රහ ණාර්ථඃ, සවේර්ණෝ'ලිති ග්‍රාහ්‍යඃ, කථම්?

අභිවන්දය, කායාදිවාරත්‍රයෙන් සකසා වැඳ; වාඳුසිඤ්ඤ, වඳු ව්‍යාකරණ නමැති මහාසමුද්‍රයෙහි; බිඳුම්, ජලකණිකාවක් බඳුවූ; බාලාව බොධනම්, බාලාවබොධන නම්, ප්‍රකරණය; අහම්, මම; කරෝම්, කෙරෙම්; හෙවත් ප්‍රකාශකොට කියම්.

"අඉඋණ්" යනු සූත්‍රයයි; එනපදයි; සෘෂක්; එඔඞ්; ඓඖව් හයවරලණ්; සඳමඩණනම්; ඣඛඝඪ්; ඝඪදශ්; ඛඵඡඨථ චටතව්; කපය්; ශෂසර්; හල් යන මේතැන් දක්වා මෙම ක්‍රමයෙන් අවබිණියයුතුයි.

ඉති මේ(අනන්තරොක්තක්‍රමයෙන් දක්වනලද) වණී සමූදය නෙමේ; ප්‍රත්‍යාහාරඃ, ප්‍රත්‍යාහාරශබ්දවාච්‍යනම්, "ප්‍රත්‍යාහ්‍රියතෙඅනෙනසං ඝ්‍රියප්‍ය භාවභාවනත ඉණී අණොඅනෙනති ප්‍රත්‍යාහාරඃ" යනුහෙයින් වණීයන්ගේ අවිහල් යනාදීන් හකුලුවා ගැන්මට අත්‍යපේ යෙන් උපකාරව සිටියාවූ "අඉඋණ්" යනාදිවූ මේ වණී සමූ දය ප්‍රත්‍යාහාරනමැයිසේයි.

2 විසර්ජනීය, විසර්ජනීයය; ජිහ්වාමූලීය, ජිහවාමූලීයය; උපා ධ්මානීය, උපාධ්මානීයය; අනුසාරාණාම්, අනුසාරය යන මොවුන්ගේ; * ඉහ, මේ ප්‍රත්‍යාහාරයෙහි; අනිර්දේශඃ, නොදැක්වීම; ප්‍රත්‍යාහාර, ප්‍රත්‍යාහාරයෙන් වන; කාර්‍ය්‍ය, යණාදේශාදිකාර්‍ය්‍යයාගේ; අසම්භවාත්, සම්භවය නැතිහෙයිනි; දිඞ්ආදි, දිඞ්ආදීන්ගේ; ග්‍රහණම්, ගැන්ම; †ජාතිනිර්දේශාත්

ඒ නොමැතිව්, "හයවරලණ්"යි එක් සූත්‍රයක් කොට ප්‍රත්‍යාහාර සූත්‍රතෙළසක්ම චන්ද්‍රාචාර්‍ය්‍යයන්ට අභිමතයි, එසේම ශාකටායන ව්‍යාකරණයෙහිද ශාකටායනාචාර්‍ය්‍යයන්ට ප්‍රත්‍යාහාර සූත්‍ර තෙළෙසක් අභිමතබව පෙණේ. පාණිනි ව්‍යාකරණයෙහි සෘක්පාණිනීන්ට ප්‍රත්‍යාහාරසූත්‍ර තුදුසක් අභිමතමුත් සෙසු සංස්කෘත ව්‍යාකරණාචාර්‍ය්‍යයන්ට එසේ අභිමතනොවේ.

* "උපධ්මානීය" සමහර "උඛපඡව ආධ්මායෙතෙ අනෙනසඨානෙනෙති ව්‍යුත්පත්තෙඃ උපාධ්මානශබ්දඵවෙ"ති තාරානාථඃ.

† "ආකෘතිග්‍රහණාජ්ජාතිර්ලිඞ්ගානාං න ච සර්වභාක්
සකෘදුච්චාරිත නිර්ග්‍රාහ්‍ය ගොත්‍රඤ්ච වරණෙඃ සහ
සඞ්ඛෙ නිර්ශතෙ පෙති පෘථග්ජාතිෂු දෘශ්‍යතෙ,
ආධෙයශ්චඃ ක්‍රියාජශ්ච සෝ'සති ප්‍රකෘතිගුණඃ"යි.

සිඞ්හෙම්වන්දඃ

I. 3. 1.
1 **ආදි ඝිනා සමඛ්‍යඃ.** 1, 1, 1.

ආදි රනෙන්‍ය නෙතා ලක්‍ෂිතෙ. ගෘහ්‍යමාණෙ මඛ්‍යෙ සහ ග්‍රාහ්‍යඃ, **එව** මව් හලිනි වණ්‍ඃ සුට් සුප් සුප් නිඞ් තඞ් සඞිනි ප්‍රත්‍යයාශ්ච.

සාමාන්‍යයෙන් දැක්වූහෙයිනි; (යම්සේ ශ්වෙතවණ්‍ඃදින් යුක්තවූ එක ම ගොව්‍යක්තියදක්වා මේගොන්තමැයි ජාතිනිදේශයකළකල සෙසු නොදක්වනලද කෘෂ්ණවණ්‍ඃදින් යුක්තවූ ගොව්‍යක්තීන්ගේ උද්ග්‍රහ ණයවේද, එසේම අකාරාදි ව්‍යක්තිදර්ශනයෙන් ජාතිය දැක්වූහෙයින් නොදක්වනලද සෙසු දීර්ඝ පලුත උදාත්තානුදාත්ත සවරිත සානුනා සික නිරනුනාසික භෙදයෙන් භින්නවූ එකම අකාරාදි ව්‍යක්තීන් ගේ ග්‍රහණයවෙයිසේයි.)

හකාරාදිඃ, හකාරාදීන්කෙරෙහි; **අකාරඃ**, අකාරතෙම; **උච්චා රණාර්ථඃ**, සුඛොච්චාරණය ප්‍රයොජනකොටඇත්තේයි ("හයවරලණ්" යනාදියෙහි අවරහිතවූ හකාරාදීන් සුවසේ කියාගතහෙතාහැකිහෙයින් හකාරාදීන්කෙරෙහි අකාර සුවසේ කියාගන්නා පිණිසය, එහෙයින් හල් ප්‍රත්‍යාහාරාදියගන්නාකළ කෙවලවූහකාරාදීහුමගන්නා ලැබෙතියි යනු භාවයි) හකාරස්‍ය, හකාරයාගේ; ප්‍රනඃපාඨඃ, නැවත හැදෑරීම; **වල්ග්‍රහණාර්ථඃ**, වල්ප්‍රත්‍යාහාරයාගේ ග්‍රහණය ප්‍රයොජන කොට ඇත්තේයි. (ඉදින් " හයවරලණ් " යන තන්හි හකාර හදුළහයි සිනා නැවත " හල් " යන තැන නොහදුළහොත් වල්ප්‍රත්‍යා හාරයෙහි ආදිහකාරය ඇතුළත්නොවනහෙයින් "රුදිහි" "සවපිහි" යනාදිතන්හි යවලාදිහවන්නාවූ ඉට් නොවන්නේය. එහෙයින් " රුදිහි " " සවපිහි " යනාදි උදාහරණයෙහි ඉඩාදි කාර්‍යසිඝ්‍රහා වල්ප්‍රත්‍යාහාරය ගැනුම් පිණිස නැවත හකාරයාගේ හැදෑරීමය යනු භාවයි.)

සර්වඃවණ්‍ඃ, සියලු වණ්‍ඃතෙම; අලිහි, අල්කියා; ග්‍රාහ්‍යඃ, ගන්නා ලැබේ; කඃග්‍රාහ්‍යඃ?, කෙසේගන්නාලැබේදයත්?
" ආදිරන්‍යසමඛ්‍යඃ " යනු පරිභාෂාසූත්‍රයි. මේ පරිභාෂාසූත්‍ර සාමර්ථ්‍ය යෙන් ගන්නාලැබේ; ආදිඃඅනුපදය; ඉත්‍යනුපදය; සමඛ්‍යඃඅනුපදඝ්.

අනෙන්‍යත, කෙළවරවූ; ඉත්‍ය, ඉත්හුවිසින්; **ලක්‍ෂිතඃ**, හඳුන් වනලද; ආදිඃ, ආදිවණ්‍ඃතෙම; ගෘහ්‍යමාණඃ, (අල්යනාදි ඒ ඒ සූත්‍රප්‍ර දේශයෙහි) කියනුලබත්නේ; **මඛ්‍යෙඃසහ**, මධ්‍යප්‍රතීතවණ්‍ඃයත් හා සමග; ග්‍රාහ්‍යඃ, ගන්නාලැබේ; **අච්හල්ඉති**, අච් හා හල් යනාදීවූ; වණ්‍ඃඃ, **වණ්‍ඃසඞ්ග්‍රාහකප්‍රත්‍යාහාරයෝද**; සුට්සුප්සුප්නිඞ්තඞ්සඞ් ඉති, සුට්හා සුප්හා සුප්හා නිඞ්හා සඞ්ඝන; ප්‍රත්‍යයාශ්ච, **ප්‍රත්‍යයසඞ්ග්‍රාහක ප්‍රත්‍යාහාරයෝද**; එවම්, මෙසේමැයි.

හ්‍රස්වා දීර්ඝ පලුත ඉත්‍යවණී යඩ්ධා භිනත්‍ර, ප්‍රතරෙකශ උදත්තෙනා නුදත්තත්‍ර සවරිත ඉති නවධා, ප්‍රතඃ ප්‍රත්‍යෙකං සානුනාසිකෙනා නිරනුනාසිකශ්චෙත්‍යෂ්ටාදශධා, එවම්වණීවණීඒණීඃ, ශවණීස්‍ය දීර්ඝා න සන්‍ති, ඉතෙන ස වාදශප්‍රභෙදඃ, සඩ්ඛ්‍යෂ්ඨරාණාං හ්‍රස්වා න සඋති, ඉතෙන තානාප්‍යෙකතශෙ වාදශප්‍රභෙදා‍ති, යදෙකනවිපරිතොච්චාරණ මසං සකෘතම්, ඒප්‍රභෙද යවලඃ සානුනාසිකා නිරනුනාසිකාශ්චෙති මන තරෙ භිනත්‍රඃ, තත්‍රාඊමාත්‍රිකෙ හ්‍රස්වඃ, ඒමාත්‍රෙ දීර්ඝඃ, ත්‍රිමාත්‍රඃ පලුතඃ, උච්චෙරුදත්තඃ, නීචෙරනුදත්තඃ, තයොඃ සමාහාරඃ සවරිතඃ, සව සථානනාසිකාඃ සානුනාසිකාඃ, ඉතරෙ නිරනුනාසිකාඃ.

(යම්සේ අල්ප්‍රත්‍යාහාරත්‍රයම් අත්‍රතවූ ලකාරයාවසින් හදුන්ව නලදආදිවූ අකාරයාඇන්තේ මධ්‍යපතිතවණීයන් හා එක්කොට "ආදිරිතාසමධ්‍යඃ" යන පරිභාෂාසූත්‍රසාමර්ත්‍යයෙන් ගන්නාලැබේද එසේම සෙසු අච්හල් යනාදිවූ වණීසඩ්ග්‍රාහක ප්‍රත්‍යාහාරයෝද සුච් සුප්සුප්තිඩ්තඩ්සඩ්යන ප්‍රත්‍යයසඩ්ග්‍රාහකප්‍රත්‍යාහාරයෝද අත්‍රතවූ ඉත්හුවසින් දක්වනලද ආදිවණීයන් ආදිප්‍රත්‍යයන් ඇත්තාහුද මධ්‍යපතිතවණීයන්හා එක්කොට "ආදිරිතා සමධ්‍යඃ" යන පරිභාෂා සූත්‍රසාමර්ත්‍යයෙන් ගන්නාලැබෙත්යිසේයි; මෙහි සුවිනම්—සුඹඃජස් අම්ඔඃට් යන මොහුයි, සුප් සුප් කියා දෙවිටකකීයේ අලාසවාදී මහා සවාදි දෙදෙත ගන්නාපිණිසයි, අලාසවාදිහුනම්,— සුඹඃජස්අම්ඔඃ ට්ශස්ටාභ්‍යාම්භිස්ඞෙභ්‍යාම්භ්‍යස්ඞසිභ්‍යාම්භ්‍යස් ඞස්ඔස්ආම්ඕඔස් සුප් යන මෙහි විධානකළප්‍රත්‍යයෝයි, මහාසවාදිහුනම්,— සවාදිසූත්‍රයෙහි ප්‍රථමාඑකවචනවූ සුවිහකනියෙහි පටන්කොට "උරොභ්‍යඃකප්" යන සූත්‍රයදක්වා මේ දෙඅතුරෙහි විධානකළප්‍රත්‍යයෝයි, නිඩ්නම්,—තිස් තස් ඣි සිප් ඵස් ථ මිප් වස් මස් තා තාම් ඣ ඵාස් ආථාම් ධ්වම් ඉට් වහි මහිඩ් යන මොහුයි, තඩ්නම්,— ත ආතාම් ඣ ඵස් ආතාම් ධ්වම් ඉට් වඃ මහිඩ් යන මොහුයි සඩ්නම්,—"තිප්‍යඃඣාඥෙනෘ සන්" යන්නෙහි සන් පටන් "ලඃසාර්වධාතුකාදි" සූත්‍රයෙහි මහිඩ් දක්වා මේ ෙදඅතුරෙහි විධානකළප්‍රත්‍යයෝයි)

අවණීඃ, අවණීත්‍රම්; හ්‍රස්වඃ, හ්‍රස්වය; දීර්ඝඃ, දීර්ඝය; පලුතඃඉති, පලුතශ්චෙ; ත්‍රිධා, තුන්පරිද්දෙකින්; භිනත්‍රඃ,බිඳුනේයි; ප්‍රතඃ,නැවත; එකශඃ, හ්‍රස්වාදිඑකක්ම; (1)උදත්තඃ,උදත්තය; අනුදත්තඃ, අනුදත්ත

---

(1)"ශ්‍රැතිකෘතමුදත්ත මුපාංශුප්‍රයොගෙ'ප්‍යුපපන්නාං ශ්‍රැතිප්‍රකර්ෂ්‍යස්‍යෙව සර්වතඃවාදනඃසථානකෘතංතදිති,උච්චෛරිත්‍යධිකරණශක්තිප්‍රධානම් අධිකරණඤ්චං වොච්චාරණමුත්‍රති,තචවතාලාදිනාංසභාගතෙව එවවති චාශ්‍රයෙතාහතාල්වාදිති,ප්‍රයතනඃප්‍රතොච්චාරයිෂ්‍යදීදෙඞ්භාශෙප්‍රතිභතෙතා

ය;(2)සවරිතඃඉති, සවරිතයයි; නවඛා, නවපරිද්දෙකින්; භිනත්ති,බිඳ නේයි; පුනඃ, නැවත; ප්‍රත්‍යෙකම්, හ්‍රස්වඋදාත්තාදිවූඑකෙක්ම; (3)සා නුනාසිකඃ, සානුනාසිකඃ; නිරනුනාසිකඤ්චෙති, නිරනුනාසිකයයි කියා; අෂ්ටාදශධා, අටළොස්පරිද්දෙකින්; භින්නඃ, බිදුනේයි; ඉව ණෝවණිඒණිඃ, ඉවණි උවණි සවණි යන මොහුද; එවම්, මෙසේ මැයි; (අවණියෘසේම අටළොස්භෙදයක් ඇත්තාහයිසේයි.) ශවණි ස්‍ය, ශවණියාහට; දිර්ඝඃ, දිර්ඝාක්ෂරයෝ; නසන්ති,නැති; තෙන, එහෙයින්; (දිර්ඝය හ්නැතිහෙයින්) සඃ, ඒශවණිතෙම; වාදශප්‍රභෙදඃ, දෙ ළොස් ප්‍රභෙදයක් ඇත්තේයි; සඞ්ඛ්‍යාක්ෂරාණාම්, සඞ්ඛ්‍යාක්ෂරයන්ට; හ්‍රස්වඃ, හ්‍රස්වයෝ; නසන්ති, නැති; (සඞ්ඛ්‍යාක්ෂරයෝනාම් එඔඑඔඉ යනමොහුයි) තේන, එහෙයින්; (හ්‍රස්වයන්දෙදෙනනැති හෙයිනැයි සේයි) තානිඅපිසඞ්ඛ්‍යාක්ෂරාණි, ඒසඞ්ඛ්‍යාක්ෂරයෝද; එකශඃ, එකෙක් එකෙක්ම; වාදශප්‍රභෙදානි, වාදශප්‍රභෙදයක් ඇත්තාහුයි; යථොක්ත, මෙහිකීවාට; විපරීත, විරුද්ධකොට; උච්චාරණම්, කිම; අසංයුක්තම්, සංයුක්ත නොවේ; (ශවණියහට දිර්ඝයන් ඇතිකොට හා සඞ්ඛ්‍යාක්ෂරයන්ට හ්‍රස්වයන්ඇතිකොට කිවහොත් ද්‍රාක්ෂාදිවත් ම්ස සංයුක්තනොවෙයිසේයි.) යවලාඃ, යවලයනමොහු (3)සානුනාසිකාඃ, සානුනාසිකදවෙති; නිරනුනාසිකාශ්චෙති, නිරනුනාසිකදවෙතියි; විප්‍රභෙදඃ, ප්‍රභෙදවයක් ඇත්තාහුයි: ඉතරෝ, සෙස්සෝ; නභින්නාඃ, භෙදනැත්තාහුයි; (කීවාවූ අවණි ඉවණි උවණි සවණි ශවණි එව ළොඔයවල යන මොවුන්කෙරෙන් පිටත් සෙසු හකාරාදිවණියෝ භෙදනැත්තෝයයිසේයි)

(දැන් අවණාදීන්ගේ භෙදයෙහි බාලශික්ෂාක්‍රමය දක්වනුලැබේ, අවණිතෙම කාලභෙදයෙන් හ්‍රස්වය දිර්ඝය ප්ලුතයයි තුණෙක්වෙයි;

වං ව්‍යඤ්ජයති තදා ස උදාත්තඃ. එවමධොභාගෙ'නුදාත්තාඉති යඛෙදා හුශෙඛරඃ.

(2) පූර්වයොරුදාත්තානුදාත්තයොඃ එකප්‍රාක්ෂරෙසම්භවෙශෙ සති සවරිතො භවති,

" එකාක්ෂරසමාවෙශෙ පූර්වයොඃ සවරිතො බරඃ,
තතො දාත්තතරො දාත්තා දඞ්මාත්‍රාඞ් මෙව ච.
අනුදාත්තඃ පරඃ ශෙෂඃ ස උදාත්තාග්‍රැති භීවෙන්,
උදාත්තං නොව්‍යතෙ කිඤ්චිත් සවරිතඤ්චා ක්ෂරං පරම්"නි,
මෙනාරමා.

(3) මුඛසහිතනාසිකයා උච්චාර්‍යමාණඃ අනුනාසිකසංඥඃ ස්‍යාත්, මුඛ සහිතා නාසිකා මුඛනාසිකා, උව්‍යතෙනෙනෙති වචන. මුඛනාසික්‍යාව ච්‍යතමස්‍යෙති ප්‍රග්‍රහඃ,වර්ග්‍යාණාමන්ත්‍යා අනුනාසිකා වා. ශාකටායනඃ.

ස්ථානකරණප්‍රයත්නභේදා වර්ණොත්පත්තිඃ, තත්‍ර ස්ථානම්, (1) කණ්ඨ්‍යා මුඛවිසර්ජනීයානාම්, තාලුකම්ව්‍යඤ්ජනානාම්, (2) මූර්ධන්‍යා වූපූපධමානීයානාම්, ශිර ඝාව්‍රඤ්ජනාණාම්, දන්ත්‍යා ඝතුලසානාම්, කණ්ඨතාලුකම් දෙදෙතාම්, කණ්ඨ්‍යෝෂ්ඨ්‍යම්දෙදෙතාම්, දන්ත්‍යෝෂ්ඨ්‍යඃ වකාරස්‍ය, නාසිකා'නුස්වාරස්‍ය, සවස්ථානං නාසිකාච ඔඤණනමානාම්. ජිහ්වාමූලං ජිහ්වාමූලීයස්‍ය. කරණම්, ජිහ්වාමධ්‍යං තාලව්‍යානාම්, ජිහ්වාග්‍රං මූර්ධන්‍යානාම්, ජිහ්වාග්‍රං දන්ත්‍යානාම්, ශෙෂාඃ සවස්ථානකරණාඃ.

ඨවිරභෙදයෙන් හ්‍රස්වඋදාත්තය හ්‍රස්වඅනුදාත්තය හ්‍රස්වස්වරිතය; දිඝඋදාත්තය දිඝඅනුදාත්තය දිඝස්වරිතය; ප්ලුතඋදාත්තය ප්ලුතඅනුදාත්තය ප්ලුතස්වරිතයයි නවයෙක්වේ; ස්ථාන භෙදයෙන් හ්‍රස්ව උදාත්ත අකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; හ්‍රස්ව අනුදාත්තඅකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; හ්‍රස්ව ස්වරිතඅකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; දිඝඋදාත්තඅකාරතෙමේසානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; දිඝ අනුදාත්ත අකාරතෙමේ සානුනාසිකද වෙයි නිරනුනාසිකද වෙයි. දිඝස්වරිතඅකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; ප්ලුතඋදාත්තඅකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; ප්ලුත අනුදාත්ත අකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; ප්ලුත ස්වරිත අකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකද වෙයි යියාමෙසේ කාලස්වරයස්ථානභෙදයෙන් අටළොසක්වෙයි; ඉවණී උව ණීසාවණී යන මොහුද අවණ්‍යාපරිද්දෙන් කාලස්වරස්ථානභෙදයෙන්අටළොසක්වෙත්; ශවණීතෙමේ කාලභෙදයෙන් හ්‍රස්වඝ ප්ලුතයයි දෙකෙක්වෙයි; ස්වරභෙදයෙන් හ්‍රස්වඋදාත්තය හ්‍රස්වඅනුදාත්තය හ්‍රස්වස්වරිතය ප්ලුතඋදාත්තය ප්ලුතඅනුදාත්තය ප්ලුතස්වරිතයයි සයෙක්වෙයි; ස්ථානභෙදයෙන් හ්‍රස්වඋදාත්තඝකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; හ්‍රස්වඅනුදාත්තඝකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; හ්‍රස්වස්වරිතඝකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; ප්ලුතඋදාත්තඝකාර තෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; ප්ලුතඅනුදාත්තඝකාරතෙමේ

---

(1) "අෂ්ටෞ ස්ථානානි වර්ණානා මුරඃ කණ්ඨඃ ශිරස්තථා,
ජිහ්වාමූලඤ්ච දන්තාශ්ච නාසිකොෂ්ඨෞ ච තාලුව."යි
පාණිනීශික්ෂා.

"කණ්ඨ්‍යාඃ මුඛජිහ්වා-දන්තෝ ෂ්‍යතාලුනාසිකා වර්ණානාම්,
ස්ථානාන්‍යාස්‍යංසප්‍රෂෙට -ෂ්තසප්‍රෂවංව්‍යවතෙෂද්විවෘතම්" යි
ශාකටායනඃ.

(2) "ඉෂ්‍යාවූපූපධමානීයානාම් " යනු අන්‍යමතයෙකි.

සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; ප්ලුතස්වරිතශ්කාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයිකියා මෙසේ කාලස්වරස්ථාන භෙදයෙන් දොළොසෙක්වෙති.)

(එකාරතෙමේ කාලභෙදයෙන් දිඝිය ප්ලුතයයි දෙතෙක්වෙයි, සවරභෙදයෙන් දිඝිඋදාත්තය දිඝිඅනුදාත්තය දිඝිස්වරිතය, ප්ලුත උදාත්තය ප්ලුතඅනුදාත්තය ප්ලුතස්වරිතයයිකියා සයෙක්වේ, ස්ථානභෙදයෙන් දිඝිඋදාත්තඑකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි, දිඝිඅනුදාත්ත එකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; දිඝිස්වරිතඑකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; ප්ලුතඋදාත්තඑකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; ප්ලුතඅනුදාත්තඑකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයි; ප්ලුත ස්වරිත එකාරතෙමේ සානුනාසිකදවෙයි නිරනුනාසිකදවෙයිකියා කාලස්වරස්ථානභෙදයෙන් දොළොසෙක්වෙයි; ඔකාර ඒකාර ඕකාර යන මොහුද එකාරයමේන් කාලභෙදයෙන් දෙකෙක්වෙති, සවරභෙදයෙන් සයෙක්වෙති, ස්ථානභෙදයෙන් දෙළොසෙක්වෙති. යකාරතෙමේ ස්ථානභෙදයෙන් සානුනාසිකදවෙයි නිරනුනාස්කදවෙයි කියා දෙකෙක්වෙයි. වකාර ලකාර යනමොහුද මෙසේම දෙකෙක්වෙත්.)

තත්‍ර, එහි; (හ්‍රස්වාදින් අතුරෙහියයි සේයි) (3) මාත්‍රිකඃඅව්, මාත්‍රාවක්ඇති අවිතෙමේ; හ්‍රස්වඃ, හ්‍රස්වනම්; (මේ මාත්‍රාවෙක්නම් නිමේෂකාලයක්හුාවත් උන්මේෂකාලයක්හා වත් සමානවූ කාලයයි) ත්‍රිමාත්‍රඃඅව්, මාත්‍රාදෙකක් ඇති අවිතෙමේ; දිඝිඃ, දිඝිනම්; ත්‍රිමාත්‍රඃඅව්, මාත්‍රාගුණක්ඇති අවිතෙම; ප්ලුතඃ, ප්ලුතනම්; උච්චෛඃඅව්, උඞ්චභාගඃයහි උත්පන්නවූ අවිතෙමේ; උදාත්තඃ, උදාත්තනම්; නීචෛඃඅව්, නීචභාගයෙහි උත්පන්නවූ අවිතෙමේ; අනුදාත්තඃ, අනුදාත්තනම්; (මෙහි ඔෂ්ඨාදිකරණාධ්‍යයනයෙන් ව්‍යවස්ථිතවූ භාගඇත්තාවූ නාදිස්ථානයෙහි උඞ්චභාගයෙහි උත්පන්නවූයේ උදාත්තනම, නීචභාගයෙහි උත්පන්නවූයේ අනුදාත්තනමැයිසේයි.) තයොඃ. උදාත්තඅනුදාත්තවර්ණයන්දෙදෙනාගේ; සමාහාරඃඅව්, එක්වීමඇත්තාවූ අවිතෙමේ; ස්වරිතඃ, ස්වරිතනම්; (මෙහි උච්චාරණකාලයෙහි සවිඛභානුසාරිවූ ප්‍රයත්නය තීව්‍රවන්නේය ගාත්‍රනිග්‍රහයවන්නේයඋදාත්තයාගේගුණයි. කණ්ඨ්‍යවිවෘතයාගේ සංවෘතත්වය වන්නේය ස්වරයාගේද වායුහුගේද තීව්‍රගතිය හෙතුකොටගෙන රූක්ෂත්වය වන්නේය අනුදාත්තයාගේ

(3) එකමාත්‍රොච් භවේද්හ්‍රස්වෝ ච්මාත්‍රෝ දීඝි උච්යතෙ,
ත්‍රිමාත්‍රස්තු ප්ලුතෝ ඥෙඞ්‍යෝ ව්‍යඤ්ජනං තඞ්මාත්‍රකම්"යි

ද කියනලදි,

ගුණයි, උච්චාරණකාලයෙහි යථොක්තාවූ උදාත්තානුදාත්ත ගුණයන් දෙදෙනාගේ එක්වීම ඇත්තේ ස්වරිතය යනුහාවයිද සවසථාන, තම තමන්ටකිසථානහා; නාසිකාඃ, නාසිකාසථානකොට ඇත්තාහු; (1) සානුනාසිකාඃ. සානුනාසිකයහ; ඉතරෙ, සෙස්සෝ; නිරනුනාසිකාඃ, නිරනුනාසිකයෝයි.

වණී, අක්ෂරයෝ ගේ; උත්පත්තී, ඉපැත්ම; සථානකරණප්‍රය හෙනාඃ, සථානකරණප්‍රයත්නයයනමෙයිනි; තත්‍ර, ඒසථානකරණ ප්‍රයත්නයන මොවුන්අතුරෙහි; සථානම්, සථානඝ; (උච්‍යතෙ කියනු ලැබේ.) අකුහවිසර්ජනීයානාම්, අ,අවණී; කු, කවගී; (කඛගඝඞ) හවි සර්ජනීයානම් (2) හකාරවිසර්ජනීයයන මොවුන්ට; කණ්ඨඃ. කණ්ඨය තෙමේ: (සථානමහවති, සථානවේ.) ඉවුයඤානාම්, ඉ,ඉවණී; වු,චවගී; (චඡජඣඤ) යඤානාම්, යකාර ශකාර යන මොවුන්ට; තාලුකම්, තල්ල: (සථානමහවති, සථානවේ.) උපුපාධමානීයානාම්, උ, උවණී; පු, පවගී; (පඵබහම) උපාධමානීයානාම්,උපාධමානීයයනමොවුන්ට; ඔෂ්ඨෝ, ඔෂ්ඨයෝදෙදෙන; (සථානමහවති, සථානවේ) ඍවුරඤාණාම්, ඍ,ඍවණී; වු, වවගී: (ටඨඩඪණ)රඤාණාම්. රෙඵෂකාරයනමොවුන්ට; ශිරඃ, හිස; (සථානමහවති, සථානවේ;) ඤතුලසානාම්, ඤ. ඤවණී; තු, තවගී; (තථදධන) ලසානාම්, ලකාරසකාරයනමොවුන්ට; දන්තාඃ, දන්තයෝ: (සථානමහවති, සථානවේ) ඉදෙදෙතාම්, ඉත් එත් ඒත යන මොවුන්ට; කණ්ඨතාලුකම්, කණ්ඨහාතල්ල; (සථානමහවති, සථානවේ) උදෙදෙඖතාම්, උත් ඔත් ඖත් යනමොවුන්ට; කණ්ඨොෂ්ඨම්, කණ්ඨහාඔෂ්ඨය; (සථානමහවති, යථානවේ.) වකාරස්‍ය, වකාර යහට: දන්තොෂ්ඨඃ, දන්තයන්හාඔෂ්ඨය, (සථානමහවති, සථානවේ) අනුඃචාරස්‍ය, අනුඃචාරයහට: නාසිකා, නාසිකාතොමෝ; (සථානමහ වති, යථානවේ.) ඛඤණනමානාම්, ඛඤණනමයනමොවුන්ට; ස්ව සථානම්, තමතමන්ටකිසථානද; නාසිකාව, නාසිකාවද; (යථානමහ වති, සථානවේ) ජිහ්වාමූලීයස්‍ය, ජිහ්වාමූලීයහට; ජිහ්වාමූලම්, දිවමූ ල; (සථානමහවති, සථානවේ.)

---

(1) " හ්‍රස්වදීඝ්ලුතහලෝ හ්‍යකච්ත්‍රයඞ්මාත්‍රිකාඃ,
නාසිකා මනුයාතශ්ච වණීඃ ස්‍යාද නුනාසිකඃ.
උච්චෙවරුදාත්තා නීචෛඃ ස්‍යාදනුදාත්තඃ සවරස්තථා,
ව්‍යාමිශ්‍රඃ සවරිතෝ ඥෙයඃ ප්‍රත්‍යෙකං විබුධෙ රිහ." යිද
ශාකටායනඃ.

(2) " හකාරං පඤ්චමෛර් යුක්ත මන්තස්ථාභිශ්ච සංයුතම්,
ඔෂ්‍රස්‍යං තං විජානීයාත් කණ්ඨ මාහුර සංයුතම්." යිද ශික්ෂා

